# (ඉ) මුදල් හා බැංකු කටයුතු හැඩගැස්ම

1964 දී මුදල් සැපයුමෙහි සෑහෙන වැඩිවීමක් ඇතිවුවද, එය ඉකුත් වසරේදී වූ මූල්‍ය ප්‍රසාරණය තරම් නොවීය. පෞද්ගලික අංශය [1] සමග කෙරුනු ගනුදෙනු නිසා වෙළඳ බැංකු ණය පරිමාව රු. කෝටි 9·20 කින් වැඩිවිය. 1963 දී වෙළෙඳ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙනු ලැබූ ණය වැඩිවූයේ රු. කෝටි 13·69 කිනි 1963 දී මහ බැංකුව සහ වෙළෙඳ බැංකු විසින් රජයට දෙනු ලැබූ ණය රුපියල් කෝටි 16·69 කින් වැඩිවුවද, සමාලෝචිත වසර තුළ රජයට දුන් බැංකු ණය වැඩිවූයේ රු. කෝටි 10·46 කිනි. 1963 දී රු. කෝටි 5.32 කින් පිරිහුනු බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශිය වත්කම් 1964 දී රු. කෝටි 3·64 කින් අඩුවිය. මේ අනුව, බැංකු ක්‍රමය විසින් මවන ලද මුළු ණය පරිමාව (එනම් බැංකු විසින් රජයට හා පෞද්ගලික අංශයට දුන් ණය පරිමාවෙන්, වසර තුළ බැංකු ක්‍රමය සතුවූ ශුද්ධ විදේශිය වත්කම් පිරිහුනු ප්‍රමාණය අඩුකළ විට වූ ඉතිරිය) – 1963 දී ඇතිවූ රු. කෝටි 25·06 ක වැඩිවීම හා සසඳන විට, 1964 දී රු. කෝටි 16·02 කින් වැඩිවූ බැව් පෙනේ.

**ද්‍රවශීලතා වර්ධනය**

1963 දී රු. කෝටි 29·80 කින් හෙවත් සියයට 11·2 කින් වැඩිවූ බැංකු නොවන පෞද්ගලික අංශය සතුවූ මුළු ද්‍රවශීල වත්කම් 1964 දී රු. කෝටි 26·66 කින් හෙවත් සියයට 9·0 කින් වැඩිවිය. එසේ වුවද, 1963 දී රුපියල් කෝටි 16.33 කින් වැඩිවූ මූලික ද්‍රවශීලතාව [2] සමාලෝචිත වසර තුලදී වැඩිවූයේ රු. කෝටි 11·58 කිනි. අනික් අතින් 1964 දී ද්විතියික ද්‍රවශීලතාව [3] වැඩිවීම 1963 දීට වඩා විය. 1963 දී රුපියල් කෝටි 13·47 කින් වැඩිවූ ද්විතියික ද්‍රවශීල වත්කම් 1964 දී රු. කෝටි 15·08 කින් වැඩිවිය.

මීලඟ පිටුවෙහි එන II ඉ–1 සංඛ්‍යා සටහනෙහි බැංකු නොව පෞද්ගලික අංශය සතු ද්‍රවශීල වත්කම් මූලික හා ද්විතියික ද්‍රවශීල වත්කම් වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙද දක්වේ.

1963 දී රු. කෝටි 29·80 කින් හෙවත් සියයට 11·2 කින් වැඩිවූ බැංකු නොවන පෞද්ගලික අංශය සතු මුළු ද්‍රවශීල වත්කම් 1964 දී රු. කෝටි 26·66 කින් හෙවත් සියයට 9·0 කින් වැඩිවිය. මුළු ද්‍රවශීල වත්කම් දල ජාතික නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් දැක්වූ විට, 1963 දී සියයට 43·9 ක්ව තිබී 1964 දී සියයට 45·2 දක්වා වැඩිවී ඇත.

1964 දී පෞද්ගලික අංශය සතු ද්‍රවශීල වත්කම් පරිමාව වැඩිවීම ප්‍රධාන වශයෙන්ම මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්, තැන්පතු, සහ රජයේ ණයපත් වැඩිවීම නිසා ඇති වූවකි. 1963 දී රු. කෝටි 11·58 කින් හෙවත් සියයට 16·2 කින් වැඩිවූ මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් 1964 දී රු. කෝටි 2·46 කින් හෙවත් සියයට 3·0 කින් වැඩිවිය. මහජනයා අතැති ඉල්ලුම් තැන්පතු පරිමාව පෙරට

1. මහ ආණ්ඩුව, වෙළෙඳ බැංකු සහ මහ බැංකුව හැර රජයේ සමායතන, ප්‍රාදේශිය බල මණ්ඩල සමුපකාර ආයතන සහ විවිධ අර්ධ රාජ්‍ය සංස්ථාවන් හෝ රජයේ මෙහෙයීමෙන් ආරම්භක සංස්ථාවන් හා නියෝජ්‍යත්වයන් ඇතුළු අන් සියල්ලන්ම පෞද්ගලික අංශය වශයෙන් ගැනේ.

2. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතු—(එනම් මුදල් සැපයුම)

3. මහජනයා සතු කාලින හා ඉතිරි කිරීම් තැන්පතු, රජයේ සුරැකුම් පත්, බඳු සංචිත සහ ඉතිරි කිරීම් සහතික සහ විදේශිය සංචිත.

## සංඛ්‍යා සටහන II (ඉ) 1

## බැංකු නොවන පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය

## 1962—1964

| විස්තර | ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | | | දළ ජාතික නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් (අ) | | |
|---|---|---|---|---|---|---|
| | 1962 | 1963 | 1964 | 1962 | 1963 | 1964 |
| 1. මූලික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) නෝට්ටු හා කාසි .. .. .. | 712·6 | 828·4 | 853·0 | 11·1 | 12·3 | 12·0 |
| (ආ) ඉල්ලුම් තැන්පතු .. .. .. | 630·0 | 677·7 | 768·8 | 9·8 | 10·1 | 10·8 |
| එකතුව .. .. .. .. | 1342·7 | 1506·0 | 1621·8 | 20·9 | 22·4 | 22·8 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | + 12·2 | +7·7 | | | |
| 2. ද්විතීයික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති ඉතිරිකිරීම තැන්පතු .. .. .. | 140·9 | 165·2 | 193·5 | 2·2 | 2·5 | 2·7 |
| (ආ) තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතිරිකිරීම් තැන්පතු .. | 362·3 | 375·5 | 393·4* | 5·6 | 5·6 | 5·5 |
| (ඇ) ලංකා ඉතිරිකිරීම් බැංකුව වෙතැති ඉතිරිකිරීම් තැන්පතු .. .. | 75·4 | 77·2 | 79·3* | 1·2 | 1·1 | 1·1 |
| (ඈ) වෙළෙඳ බැංකු වෙතැති කාලීන තැන්පතු .. .. .. .. | 263·7 | 302·8 | 327·0 | 4·1 | 4·5 | 4·6 |
| (ඉ) මෙරට පදිංචිකරුවන් සතු විදේශීය ශේෂ | 21·0 | 15·9 | 15·9* | 0·3 | 0·2 | 0·2 |
| (ඊ) ඉතිරි කිරීම් සහතික .. .. | 32·9 | 34·4 | 37·4 | 0·5 | 0·5 | 0·5 |
| (උ) භාණ්ඩාගාර බිල්පත් .. .. | 2·8 | 0·5 | 0·5 | ... | ... | ... |
| (ඌ) බදු සංචිත සහතික .. .. .. | 17·2 | 25·3 | 41·5 | 0·3 | 0·4 | 0·6 |
| (එ) රජයේ ණයපත් .. .. .. | 392·5 | 446·6 | 505·7 | 6·1 | 6·6 | 7·1 |
| එකතුව .. .. .. | 1308·7 | 1443·4 | 1594·2 | 20·4 | 21·5 | 22·4 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | + 10·3 | +10·4 | | | |
| 3. පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් | 2651·4 | 2949·4 | 3216·0* | 41·3 | 43·9 | 45·2 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | +11·2 | + 9·0 | | | |
| ඉහත සංඛ්‍යාවලට තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව, ලංකා ඉතිරි කිරීම් බැංකුව සේවක අර්ථසාධක අරමුදල ආදී රජයේ මූල්‍ය ආයතන වෙතැති භාණ්ඩාගාර බිල් හා රජයේ ණයපත් ඇතුලත් කොට නොමැත. | 764·4 | 886·6 | 1022·9 | 11·9 | 13·2 | 14·4 |

සංඛ්‍යා— ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) පවත්නා සාධක වියදම් මිල අනුව

* තාවකාලිකයි.

එඩා සීඝ්‍රයෙන් රුපියල් කෝටි 9·11 කින් හෙවත් සියයට 13·4 කින් ඉහළ ගියේ ය. පසුගිය අවුරුද්ද තුළ ඉල්ලුම් තැන්පතු වැඩි වූයේ රු. කෝටි 4·77 කින් හෙවත් සියයට 7·6 කිනි. වෙළඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු හා අනිකුත් ඉතිරි කිරීම් සංස්ථාවන්හි තුබූ ඉතිරි කිරීම් තැන්පතු එකතුවද, රු. කෝටි 7·25 කින් හෙවත් සියයට 7·9 කින් වැඩිවිය. ඉකුත් වසර තුළ මේ තැන්පතු වැඩි වූයේ රු. කෝටි 7·84 කින් හෙවත් සියයට 9·3 කිනි. 1963 දී රු. කෝටි 5·41 කින් හෙවත් සියයට 13·8 කින් ඉහළ ගිය මහජනයා වෙතැති රජයේ ණයපත් පරිමාව තවත් රුපියල් කෝටි 5·91 කින් වැඩිවිය. මහජනයා සතු බදු සංචිත සහතිකද රු. කෝටි 1·62 කින් හෙවත් සියයට 64·0 කින් වැඩිවිය.

1964 දී පෞද්ගලික අංශය සතු ද්‍රවශීල වත්කම්, සංයුතිය අතින්ද වැදගත් වෙනස්වීම් රැසකට භාජන වූ බැව් පෙනේ. 1963 දී රටතුළ ද්‍රවශීලතාව වැඩිවීමට හේතු වූ ප්‍රධානතම බලපෑම වූයේ මූලික ද්‍රවශීල වත්කම් රු. කෝටි 16·8කින් ඉහළ යාමය. එහෙත් 1964 අවුරුද්ද තුළ මූලික ද්‍රවශීලතාවෙහි ඇති වූ රු. කෝටි 11·6 ක

වැඩිවීම, සාපේක්ෂිත වශයෙන් පෙරට වඩා අඩුවිය. 1964 දී මුළු ද්‍රවශීලතාව වැඩිවීමට මුල් හේතුව වූයේ ද්විතියික ද්‍රවශීල වත්කම් රු. කෝටි 15·1 කින් වැඩි වීමය. දෙවැනිව, මුළු ද්‍රවශීල වත්කම් වැඩිවුවද, මුළු ද්‍රවශීල වත්කම් කෙරෙහි වූ මුදල් සහ ආසන්න මුදල්[1] අනුපාතය පහත වැටින. මුළු ද්‍රවශීල වත්කම් වල ප්‍රතිශතයක් වශයෙන් මුදල් සහ ආසන්න මුදල් සියයට 51·1 සිට සියයට 50·4 දක්වා පහත වැටින. මුදල් සැපයුම, වෙළඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු හා අනිකුත් ඉතිරි කිරීම් සංස්ථාවන්හි තිබූ ඉතිරි කිරීම් තැන්පතුවල ඒකාබද්ධ අනුපාතයද සියයට 82·3 සිට 1964 දී සියයට 81·3 දක්වා අඩුවිය.

1963 වාර්ෂික වාර්තාවෙහි සඳහන් වූ පරිදි පෞද්ගලික අංශය තුළ ඇති නොයෙකුත් ආර්ථික ගණයන් අතර වැඩිවූ ද්‍රවශීල වත්කම් බෙදීගිය හැටි දැක්විය නොහැක. හිමිකාර ගණයන් අනුව, පෞද්ගලික අංශය සතු රජයේ ණයපත් හා වෙළඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු පිළිබඳ විස්තර පහත එනII ඉ - 2 හා II ඉ - 3 දරන සංඛ්‍යා සටහන් මගින් දැක්වේ.

සංඛ්‍යා සටහන II (ඉ) 2.

**පෞද්ගලික අංශය සතු රජයේ ණයපත්**

රුපියල් දශ ලක්ෂ

| | 1962 | 1963 | 1964 | වෙනස 1962/63 | වෙනස 1963/64 |
|---|---|---|---|---|---|
| 1. භාරකාර මණ්ඩල, සුභ සාධක, විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල්* .. .. | 210·2 | 239·7 | 256·5 | +29·5 | +16·8 |
| 2. රක්ෂණ සංස්ථාව .. .. | 7·5 | 19·9 | 55·0 | +12·4 | +35·1 |
| 3. පෞද්ගලික රක්ෂණ සමාගම් .. .. | 114·1 | 124·3 | 129·2 | +10·2 | + 4·9 |
| 4. පුද්ගලයින් .. .. | 16·7 | 17·9 | 18·4 | + 1·2 | + 0·5 |
| 5. අනෙකුත් අය .. .. | 44·0 | 44·8 | 46·6 | + 0·8 | + 1·8 |
| එකතුව .. .. | 392·5 | 446·6 | 505·7 | +54·1 | +59·1 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* සේවක අර්ථසාධක අරමුදල් ඇතුළත් නැත.

1964 දී පෞද්ගලික අංශය සතු වූ රජයේ ණයපත් රු. කෝටි 5·91 කින් වැඩි වීමෙන් පිළිඹිබු වූයේ ප්‍රධාන වශයෙන් රක්ෂණ සංස්ථාව සහ භාරකාර මණ්ඩල, සුභ සාධක, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් සතු වූ රජයේ ණයපත් වැඩිවීමෙකි.

සංඛ්‍යා සටහන II (ඉ) 3.

**වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික අංශය සතු මුළු තැන්පතු පරිමාවෙහි වෙනස්වීම් - හිමිකරු ගණයන් අනුව**

| | 1963 | 1964 | එකතුව |
|---|---|---|---|
| 1. බැංකු නොවන මූල්‍ය සංස්ථා | – 5·0 | + 3·9 | — 1·1 |
| 2. වැවිලි | – 18·8 | – 15·7 | — 34·5 |
| 3· වෙළෙඳ ආයතන | +65·0 | +19·3 | + 84·3 |
| 4. අනෙකුත් ව්‍යාපාර | – 14·0 | +11·2 | — 2·8 |
| 5. ප්‍රාදේශිය බලමණ්ඩල | +16·6 | + 6·5 | + 23·1 |
| 6. ව්‍යාපාරික නොවන ආයතන | +31·9 | +13·8 | + 45·7 |
| 7. පුද්ගලයින් | +36,7 | +81·4 | +118·1 |
| එකතුව | +112·5 | +120·4 | +232,9 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1. මුදල් වලට දී ඇති අර්ථ නිරූපනය අනුව, මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු මුදල් ගණයට වැටේ. වෙළඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු හා ඉතිරි කිරීම් සංස්ථා වෙතැති ඉතිරිකිරීම් තැන්පතුද, ඉල්ලුම් තැන්පතු තරම් ද්‍රවශීල නොවුවද, බඳු සංචිත සහතික හා රජයේ ණයපත්වලට වඩා ද්‍රවශීල වේ.

මේ අනුව, 1964 දී පෞද්ගලික අංශය සතු තැන්පතු වැඩිවීමෙන් ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ පුද්ගලයින් සතු තැන්පතු රු. කෝටි 8·14 කින් වැඩි වීමකි. වෙළෙඳ ආයතන අනිකුත් ව්‍යාපාරයන් සහ ව්‍යාපාරික නොවන ආයතනයන් සතු තැන්පතු ද තරමක් දුරට වැඩි විය.

## 1 (අ) මුදල් සැපයුම

1964 දී මුදල් සැපයුම රු. කෝටි 11·58 කින් හෙවත් සියයට 7·7 කින් රුපියල් කෝටි 150·6 සිට රු. කෝටි 162·18 දක්වා වැඩිවිය. වසර තුළ ඇති වූ මූල්‍ය ප්‍රසාරණය ඉකුත් වසරෙහි ඇතිවූ රු. කෝටි 16·33 ක හෝ සියයට 12·2 ක වැඩිවීම තරම් නොවිය. 1963 දී රු. කෝටි 1·36 ක් වූ මුදල් සැපයුමෙහි මාසික වර්ධන වේගය 1964 දී රු. කෝටි 0·96 ක් විය.

II ඉ – 1 සටහනේ පිළිබිඹු වන පරිදි, පසුගිය අවුරුදු කිහිපය තුළ රට තුළ මුදල් තත්වය පිළිබඳ කැපී පෙනෙන අංගයක් වී පැවතියේ බැංකු නොවන පෞද්ගලික අංශය සතු ද්‍රවශීල වත්කම් අඛණ්ඩව වැඩිවීමයි. 1963 දී පෞද්ගලික අංශය සතු ද්‍රවශීල වත්කම් වැඩිවීමට මුදල් සැපයුම රු. කෝටි 16·33 කින් වැඩිවීම බොහෝදුරට ඉවහල් විය. 1964 දීද, මුදල් සැපයුම වැඩිවීම පෞද්ගලික අංශය සතු ද්‍රවශීල වත්කම් වැඩිවීමට හේතුවූ ප්‍රධාන සාධකයක් විය. එහෙත් පෞද්ගලික අංශයේ ද්‍රවශීල වත්කම් වැඩිවීම කෙරෙහි මූල්‍ය ප්‍රසාරණය මගින් ඇතිවූ බලපෑම ඉකුත් වසරෙහි තරම් නොවිය. 1963 දී පෞද්ගලික අංශය සතු ද්‍රවශීල වත්කම් ශීඝ්‍රයෙන් වැඩිවූ අතර මේ වැඩිවීමෙන් සියයට 55 ක් මුදල් සැපයුම වැඩිවීම මුල්කොටගෙන ඇති විය. එහෙත් 1964 දී පෞද්ගලික අංශය සතු ද්‍රවශීල වත්කම් වැඩිවීමෙන් සියයට 43 ක් පමණී මූල්‍ය ප්‍රසාරණය නිසා ඇති වූයේ.

සංඛ්‍යා සටහන II (ඉ) 4

මුදල් සැපයුමෙහි සැකසුම

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | |
| 1953 | 335·3 | 40·6 | 491·5 | 59·4 | 826·8 |
| 1954 | 341·8 | 35·7 | 615·3 | 64·3 | 957·1 |
| 1955 | 384·5 | 35·8 | 688·4 | 64·2 | 1072·9 |
| 1956 | 401·1 | 35·6 | 725·7 | 64·4 | 1126·8 |
| 1957 | 434·9 | 41·8 | 605·2 | 58·2 | 1040·1 |
| 1958 | 529·8 | 49·2 | 546·9 | 50·8 | 1076·8 |
| 1959 | 565·0 | 48·0 | 612·7 | 52·0 | 1177·7 |
| 1960 | 595·3 | 49·2 | 613·6 | 50·8 | 1208·9 |
| 1961 | 692·2 | 53·8 | 596·4 | 46·2 | 1288·6 |
| 1962 | 712·6 | 53·1 | 630·0 | 46·9 | 1342·7 |
| 1963 | 828·4 | 55·0 | 677·7 | 45·0 | 1506·0 |
| 1964 | 853·0 | 52·6 | 768·8 | 47·4 | 1621·8 |

සංඛ්‍යා— ශ්‍රී ලංකා මහ බැංකුව

ගත වූ තුන් අවුරුද්ද තුළ, ඉල්ලුම් තැන්පතු වැඩි වීමට වඩා ඉක්මනින් ව්‍යවහාර මුදල් වැඩිවීම ගැන ද, ඒ නිසා මුදල් සැපයුමේ සංයුතිය වෙනස් වූ ආකාරය ගැන ද, එම කාලපරිච්ඡේදයන් වෙනුවෙන් නිකුත් කරන ලද වාර්ෂික වාර්තාවන්හි සඳහන් වෙයි. ව්‍යවහාර මුදල් පරිමාව ශීඝ්‍රයෙන් වැඩිවත්ම, අඩු වටිනාකමක් ඇති නෝට්ටු ප්‍රමාණයට වඩා ඉක්මනින් වැඩි වටිනාකමක් ඇති නෝට්ටු පරිමාව වැඩිවීම ගැන ද, මේ වාර්තාවන් මගින් අවධානය යොමු කරන ලදී. 1963 දී මුදල් සැපයුම රුපියල් කෝටි 16·33 කින් වැඩි වූ බැව් ඉහත එන II ඉ–4 සංඛ්‍යා සටහනෙන් පෙනේ. මේ වැඩිවීමෙන් සියයට 71 ක් ව්‍යවහාර මුදල් වැඩිවීම නිසාද සියයට 29 ක් ඉල්ලුම් තැන්පතු වැඩිවීම නිසාද ඇතිවිය. මෙසේ මුදල් සැපයුමෙහි අඩංගු වී ඇති ව්‍යවහාර මුදල් කොටස කලක් තිස්සේ ක්‍රමයෙන් වැඩි වෙමින් පැවැත්ම සමාලෝචිත අවුරුද්ද තුළදී වෙනස් වූ බැව් පෙනේ. මුදල් සැපැයුමේ

වැඩිවීමෙන් රු. කෝටි 9·1 හෙවත් සියයට 79 ක් ඉල්ලුම් තැන්පතු වූ අතර රුපියල් කෝටි 2·5 ක් හෙවත් සියයට 21 ක් ව්‍යවහාර මුදල් විය. මුදල් සැපයුමෙහි අනුපාතයක් වශයෙන් 1963 දී සියයට 55·0 ක්වූ ව්‍යවහාර මුදල් පරිමාව 1964 දී සියයට 52·6 ක් දක්වා පහත වැටිනි.

සංඛ්‍යා සටහන II (ඉ) 5

**ව්‍යවහාර මුදල් සංයුතිය – රු. 100, 50, 10 සහ 5 හේ වටිනාකම් අනුව**

| කාලච්ඡේදය අවසානයේදී | | රු. 100 | රු. 50 | රු. 10 | රු. 5 | මුළු මුදල් නිකුතුව* |
|---|---|---|---|---|---|---|
| 1960 | .. .. .. | 148·4 | 148·4 | 237·6 | 40·1 | 644·6 |
| 1961 | .. .. .. | 211·9 | 180·3 | 254·6 | 42·1 | 763·8 |
| 1962 | .. .. .. | 238·2 | 186·8 | 241·9 | 42·8 | 789·4 |
| 1913 | .. .. .. | 275·3 | 236·7 | 257·6 | 46·5 | 900·9 |
| 1964 | ජනවාරි .. .. | 271·9 | 230·9 | 245·7 | 45·0 | 878·1 |
| | පෙබරවාරි .. .. | 274·1 | 227·5 | 244·1 | 44·5 | 874·7 |
| | මාර්තු .. .. .. | 285·5 | 234·8 | 248·5 | 45·3 | 899·8 |
| | අප්‍රියෙල් .. .. | 291·7 | 241·5 | 257·3 | 47·5 | 925·6 |
| | මැයි .. .. .. | 298·0 | 246·5 | 257·4 | 47·8 | 937·6 |
| | ජූනි .. .. .. | 242·5 | 243·4 | 295·2 | 50·5 | 918·6 |
| | ජූලි .. .. .. | 200·7 | 245·8 | 319·0 | 52·2 | 905·0 |
| | අගෝස්තු .. .. | 186·3 | 248·9 | 326·6 | 52·7 | 901·4 |
| | සැප්තැම්බර් .. .. | 170·2 | 246·2 | 335·8 | 53·3 | 892·4 |
| | ඔක්තෝබර් .. .. | 166·9 | 250·4 | 346·7 | 55·0 | 907·7 |
| | නොවැම්බර් .. .. | 165·8 | 253·4 | 352·1 | 55·0 | 917·0 |
| | දෙසැම්බර් .. .. | 168·4 | 258·3 | 359·5 | 55·5 | 932·1 |

* රුපියල් 2 සහ 1 නෝට්ටු සහ කාසි සියල්ලමද අඩංගු වෙයි. මූලාශ්‍ර:— ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

බැංකු පහසුකම් නොලබන ජන කොට්ඨාශයන්ට වාසිවෙන පරිදි ආදායම් ව්‍යාප්ත වීම, බදු නොගෙවා පැහැර හැරීමේ චේතනාවන්, හා සමහර බැංකු ගිණුම් මගින් කෙරෙන ගෙවීම් පිළිබඳව පනවා ඇති බැංකු හර බද්ද ආදී සාධකයන් නිසා ව්‍යවහාර මුදල් භාවිතය මෙසේ වැඩිවූවයි සිතිය හැකිය. 1960 න් පසු වැඩි වටිනාකමක් ඇති මුදල් නෝට්ටු අති සීඝ්‍රයෙන් වැඩිවීමෙන් මේ මතය වඩාත් ස්ථිර වේ. ඉහත එන II ඉ – 5 සටහනේ දැක්වෙන පරිදි 1960 දෙසැම්බර් සහ 1964 මැයි යන කාලච්ඡේදය තුල දී රුපියල් සියයේ හා රුපියල් පනහේ නෝට්ටු වල එකතුව රුපියල් කෝටි 24·8 කින් වැඩි විය. එම කාලය තුළ මුදල් නිකුතුවේ අනුපාතයක් වශයෙන් මේ නෝට්ටු සියයට 46 සිට සියයට 58 දක්වා ඉහළ නැංගේය. 1964 ජූනි මාසයේ සිට ව්‍යවහාර මුදල් සංයුතිය සැලකියයුතු වෙනසකට භාජනවූ බැව් පෙනේ. 1964 මැයි දෙසැම්බර් කාලච්ඡේදය තුළ රුපියල් සියයේ නෝට්ටු පරිමාව රුපියල් කෝටි 13·0 කින් අති ශීඝ්‍රයෙන් සංකෝචනය වූ අතර, රු. 50 හේ හා රු. 10 යේ නෝට්ටු පිළිවෙළින් රු. කෝටි 1·2 කින් හා රු. කෝටි 10·2 කින් වැඩි විය. අයබදු නොගෙවා මගහැරීම සහ වැඩි වටිනාකමක් ඇති නෝට්ටු වශයෙන් අප්‍රකාශිත වත්කම් රාශිකරණය කිරීම වැලැක්වීම සඳහා විධිවිධාන පැනවේතැයි යන බලාපොරොත්තු නිසා මේ වෙනස ඇතිවුනා විය හැකිය. රු. සියයේ නෝට්ටුවල අගය අඩු වේතැයි යන බියක් පැවතුන ද, ඒ නිසා සෑහෙන ව්‍යවහාර මුදල් විරාශිකාරණයක් ඇති නොවූ බව කිව යුතුයි. එහි ප්‍රතිඵලය වූයේ ව්‍යවහාර මුදල් රාශිකරණ මාධ්‍යයක් වශයෙන් වැඩි වටිනාකමක් ඇති මුදල් නෝට්ටු වෙනුවට අඩු වටිනාකමක් ඇති නෝට්ටු සාපේක්ෂිතව වැඩිවීමෙන් ව්‍යවහාර මුදල් සංයුතියෙහි වෙනසක් ඇතිවීම පමණි.

II ඉ – 6 සටහනින් 1959 – 1964 යන කාලජේදය තුල මුදල් සැපයුමෙහි ඇති වූ වෙනස්කම් විග්‍රහ කෙරේ. මුදල් සැපයුම කෙරෙහි බලපාන සාධකයන් දක්වා ඇත්තේ ප්‍රධාන ආර්ථික අංශයන් හා බැංකු ක්‍රමය අතර කෙරෙන ගනුදෙනු අනුවය. ප්‍රධාන ආර්ථික අංශයන්ගේ ගනුදෙනු අනුව මෙසේ විග්‍රහ කොට ඇත්තේ ඒවා නිසා බැංකු ක්‍රමයේ වත්කම්/වගකීම් සම්බන්ධතාවල ද, එයින් මුදල් සැපයුමේ ද වෙනස්කම් ඇතිවන හෙයිනි.

## සංඛ්‍යා සටහන II (ඉ) 6

## මුදල් සැපැයුමේ වෙනස්වීම්

රුපියල් දශ ලක්ෂ

| මුදල් සැපැයුම කෙරෙහි බලපෑ සාධක | 1958 සහ 1959 අතර | | 1959 සහ 1960 අතර | | 1960 සහ 1961 අතර | | 1961 සහ 1962 අතර | | 1962 සහ 1963 අතර | | 1963 සහ 1964 අතර | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක |
| 1. බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) | — | 195·0 | — | 170·2 | — | 78·6 | — | 91·1 | — | 53·2 | 16·9* | — |
| 2. පෞද්ගලික අංශය | | | | | | | | | | | | |
| (අ) පෞද්ගලික අංශයට දුන් ණය | 9·7 | — | 31·5 | — | 12·5 | — | 42·2 | — | 124·2 | — | 111·7† | — |
| (ආ) කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු | — | 38·8 | — | 63·8 | 9·2 | — | — | 50·2 | — | 63·4 | — | 52·5 |
| (ඇ) අනෙකුත් වගකීම් (ශුද්ධ) | 15·6 | — | — | 8·7 | — | 28·8 | — | 0·7 | 8·1 | — | — | 4·9 |
| 3. රාජ්‍යාංශය | | | | | | | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ සහ රජය විසින් සහතික කළ සුරැකුම් පත් | 30·2 | — | 6·0 | — | 21·4 | — | 71·3 | — | — | 5·4 | 0·4 | — |
| (ආ) මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය විසින් සහතික කළ සුරැකුම්පත් | 191·0 | — | 224·3 | — | 140·8 | — | 175·9 | — | 139·5 | — | 123·2 | — |
| (ඇ) මහ බැංකුවෙන් රජයට දුන් තාවකාලික අත්තිකාරම් | 61·8 | — | 21·9 | — | 1·9 | — | 3·0 | — | 7·0 | — | 6·8 | — |
| (ඈ) මහ බැංකුවේ අනිකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) | — | 27·9 | — | 19·3 | — | 9·1 | — | 18·6 | — | 10·7 | — | 54·8** |
| (ඉ) වෙළෙඳ බැංකු විසින් රජයට දෙනු ලැබූ කෙටි කාලීන ණය (ආහාර ආනයනයන් සඳහා)‡ | — | — | — | — | — | — | — | — | 25·8 | — | — | 25·8 |
| (ඊ) රජයේ රුපියල් මුදල් ශේෂයන් | 64·0 | — | 8·0 | — | 9·4 | — | — | 76·1 | — | 8·3 | — | 2·9 |
| 4. හුවමාරුවෙහි පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි | — | 9·6 | 1·4 | — | 1·0 | — | — | 1·7 | — | 0·2 | — | 2·3 |
| මුළු ප්‍රසාරණාත්මක/සංකෝචනාත්මක සාධක | 372·3 | 271·3 | 293·1 | 262·0 | 196·2 | 116·5 | 292·4 | 238·4 | 304·6 | 141·2 | 259·0 | 143·2 |
| මුදල් සැපයුමෙහි වෙනස | +101·0 | | +31·1 | | +79·8 | | +54·0 | | +163·3 | | +115·8 | |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* රජයේ සංස්ථාවන් සතුව තුබූ, රුපියල් කෝටි 5·33 ක ප්‍රකාශිත වටිනාකමක් ඇති විදේශීය වත්කම්, 1964 පෙබරවාරි මාසයේ දී මහ බැංකුව විසින්, එම සංස්ථාවන්ගෙන් මිලට ගන්නා ලදී. මේ ගනුදෙනුව අත්හලවිට, බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම් 1964 දී රුපියල් කෝටි 3·64 කින් අඩු වූ බව පෙනේ.

** වසර තුළ වැඩි වූ මහ බැංකුවේ වගකීම් වලින් රුපියල් කෝටි 5·33 ක් රජයේ සංස්ථාවන් වෙනුවෙන් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීමක් නිසා ඇතිවිය. මේ ගනුදෙනු නිසා රටතුල අලුතින් මුදල් මැවීමක් සිදු නොවිය.

† 1964 දී නිශේධ සංඛ්‍යාවක්වූ (රු. කෝටි 1·92) වට්ටම් කළ අපනයන බිල්පත් වටිනාකම ඇතුළත් නොවේ. වට්ටම් කළ අපනයන බිල්පත්වල වටිනාකම විදේශීය බැංකු වත්කම් යටතේ දක්වේ.

‡ මෙය වට්ටම් කළ අසාමාන්‍ය තාවකාලික ගනුදෙනුවක් වූ නිසා 1963 වාර්ෂික වාර්තාවේ වෙළෙඳ බැංකුවල ''අනිකුත් වත්කම්'' යටතේ දක්වන ලදී. මේ මුදල දුන් මුළුමනින්ම ගෙවා ඇත.

සංඛ්‍යා සටහන II (ඉ) 7

## මුදල් සැපයුම

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959 සහ 1960 අතර වූ වෙනස % | 1960 සහ 1961 අතර වූ වෙනස % | 1961 සහ 1962 අතර වූ වෙනස % | 1962 සහ 1963 අතර වූ වෙනස % | 1963 සහ 1964 අතරවූ වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. .. .. .. | 1,050 | 1,180 | 1 207 | 1,426 | 1,347 | 1,468 | +12·4 | + 2·3 | +18·1 | — 5·5 | + 9·0 |
| පෙබරවාරි .. .. .. .. | 1,053 | 1,192 | 1·193 | 1,561 | 1,369 | 1,501 | +13·2 | + 0·1 | +30·8 | —12·3 | + 9·6 |
| මාර්තු .. .. .. .. .. | 1,089 | 1,194 | 1,210 | 1,635 | 1,385 | 1,505 | + 9·6 | + 1·3 | +35·1 | —15·3 | + 8·7 |
| අප්‍රියෙල් .. .. .. .. | 1,084 | 1,165 | 1,306 | 1,448 | 1,400 | 1,534 | + 7·5 | +12·1 | +10·9 | — 3·3 | + 9·6 |
| මැයි .. .. .. .. .. | 1,096 | 1,163 | 1,219 | 1,317 | 1,431 | 1,547 | + 6·1 | + 4·8 | + 8·0 | + 8·6 | + 8·1 |
| ජුනි .. .. .. .. .. | 1,094 | 1,170 | 1,221 | 1,298 | 1,448 | 1,550 | + 6·9 | + 4·4 | + 6·3 | +11·5 | + 7·0 |
| ජුලි .. .. .. .. .. | 1,094 | 1,150 | 1,223 | 1,277 | 1,447 | 1,543 | + 5·1 | + 6·3 | + 4·4 | +13·3 | + 6·6 |
| අගෝස්තු .. .. .. .. | 1,095 | 1,161 | 1,231 | 1,270 | 1,474 | 1,529 | + 6·0 | + 6·0 | + 3·2 | +16·1 | + 3·7 |
| සැප්තැම්බර් .. .. .. .. | 1,128 | 1,181 | 1,261 | 1,294 | 1,499 | 1,549 | + 4·7 | + 6·8 | + 2·6 | +15·8 | + 3·3 |
| ඔක්තෝබර් .. .. .. .. | 1,153 | 1,212 | 1,248 | 1,317 | 1,505 | 1,592 | + 5·1 | + 3·0 | + 5·5 | +14·3 | + 5·8 |
| නොවැම්බර් .. .. .. .. | 1,170 | 1,219 | 1,251 | 1,307 | 1,533 | 1,603 | + 4·2 | + 2·6 | + 4·5 | +17·3 | + 4·6 |
| දෙසැම්බර් .. .. .. .. | 1,178 | 1,290 | 1,289 | 1,343 | 1,506 | 1·622 * | + 2·6 | + 6·6 | + 4.2 | +12·2 | + 7·7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සාමාන්‍යයෙන් 1964 දී මුදල් සැපැයුම වෙනස් වීමට තුඩු දුන් ප්‍රධාන සාධකයෝ පුළුල් වශයෙන් 1963 දී පැවති ඒවා ම වූහ. බැංකු ක්‍රමය සමග කෙරුණු රජයේ දේශීය ගනුදෙනුද, වෙළෙඳ බැංකු සමග කෙරුණු අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ගනුදෙනු ද ප්‍රසාරණාත්මක වූහ. විදේශීය බැංකු වත්කම් තත්වයෙන් පිළිබිඹු වූ විදේශීය ගෙවුම් හිඟය මුදල් සැපැයුම කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් ඇති කෙළේ ය. 1964 දී රජයේ අය-වැය හිඟය නිසා රටතුළ ඇති වූ මුදල් මැවීම ද, ප්‍රමාණාත්මක වශයෙන් විශාල වුව ද, ඉකුත් වසරේ තරම් නොවීය. 1963 දී රුපියල් කෝටි 15·86 ක්වූ මෙය 1964 දී රුපියල් කෝටි 10·17 ක් විය. සමාලෝචිත වසර තුළ ඇති වූ මූල්‍ය ප්‍රසාරණය පෙර වසරෙහි දී තරම් නොවූයේ සාපේක්ෂක වශයෙන් රජයේ අය-වැය හිඟය අඩු වූ නිසා බව කිව යුතුය. 1964 දී මුදල් සැපැයුම ප්‍රසාරණය වීමට හේතු වූ ප්‍රධානතම සාධකය වූයේ වෙළෙඳ බැංකු විසින් රජයේ සමායතන ඇතුළු පෞද්ගලික අංශයට ණය දීම බැව් පෙනේ. එහෙත් 1964 දී රුපියල් කෝටි 11·17 ක්වූ වෙළෙඳ බැංකු මගින් ඇති වූ දළ ණය ව්‍යාප්තිය (1) පෙර අවුරුද්දේ වූ රුපියල් කෝටි 12·42 වඩා අඩු විය.. මෙසේ 1964 දී ප්‍රසාරණාත්මක සාධකයන් මගින් මුදල් සැපයුම කෙරෙහි ඇති වූ බලපෑම 1963 දීට වඩා ප්‍රමාණාත්මක වශයෙන් අඩු විය. එහෙත් විදේශීය ගෙවුම් හිඟය හා රජයේ නොවන කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම මගින් මුදල් සැපැයුම කෙරෙහි ඇති වූ සංකෝචනාත්මක බලපෑම ද පෙරට වඩා අඩු විය. 1963 දී රුපියල් කෝටි 5·32 කින් අඩු වූ ශුඩ විදේශීය වත්කම් 1964 දී අඩු වූයේ රුපියල් කෝටි 3·64 කිනි. 1963 දී රුපියල් කෝටි 6·34 කින් වැඩි වූ බැංකු ක්‍රමය වෙතැති රජයේ නොවන කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩි වූයේ රුපියල් කෝටි 5·25 කිනි. මේ අනුව, 1964 දී මුදල් සැපැයුම රුපියල් කෝටි 11·58 කින් වැඩිවීමට මේ සාධකයෝ හේතු වූහ.

සංඛ්‍යා සටහන II (ඉ) 8

### මුදල් සැපැයුමේ වෙනස – කාර්තු අනුව

රුපියල් දශ ලක්ෂ

| | 1 වැනි කාර්තුව | 2 වැනි කාර්තුව | 3 වැනි කාර්තුව | 4 වැනි කාර්තුව | මුළු වෙනස |
|---|---|---|---|---|---|
| විදේශීය බැංකු වත්කම් (ශුද්ධ) .. | —32·4* | +13·8 | + 9·8 | +25·7 | + 16·9 * |
| රජයේ ගනුදෙනු .. .. | +32·3 | + 4·1 | — 7·7 | +73·0 | +101·7 |
| වෙළෙඳ බැංකු ණය .. .. | +45·4 | +62·1 | + 1·5 | + 2·7 | +111·7 |
| කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු .. | —22·9 | —22·4 | +10·6 | —17·8 | — 52·5 |
| මුදල් සැපයුමේ වෙනස .. .. | — 0·9 | +45·2 | — 1·4 | +72·9 | +115·8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* 1964 පෙබරවාරි මාසයේදී මහ බැංකුව විසින් රජයේ සංස්ථාවන්ගෙන් මිලට ගත්, එම සංස්ථාවන් සතුව තුබු රු. කෝටි 5·33 ක ප්‍රකාශිත වටිනාකමක් ඇති විදේශීය වත්කම් ඇතුළත් වෙයි. එනිසා ශුද්ධ විදේශීය වත්කම්වල ඇතිවූ නියම පිරිහීම පළමුවැනි කාර්තුවේදී රුපියල් කෝටි 8·57 ක් ද මුළු වසර තුල රුපියල් කෝටි 3·64 ක් ද විය.

මුදල් සැපැයුමෙහිවූ ත්‍රෛමාසික වෙනස්වීම් හා ඊට තුඩු දුන් සාධකයන් ඉහත සඳහන් II ඉ 8 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. වර්ෂයේ මුල් කාර්තුවේදී හා තෙවැනි කාර්තුවේදී මුදල් සැපැයුම සුළු වශයෙන් පහළ වැටිනි. එයින් ප්‍රධාන වශයෙන්ම පිළිබිඹු වුනෝ ජනවාරි මාසයේදී හා ජූලි මාසයේදී ඇතිවූ සංකෝචන-යන් ය. එහෙත් වර්ෂයේ දෙවැනි හා සිව්වැනි කාර්තු වලදී මුදල් සැපැයුම ශීඝ්‍ර ලෙස ඉහළ නැංගේය.

1. මෙම සංඛ්‍යාවට අපනයන බිල් වෙනුවෙන් දෙනලද අත්තිකාරම් ඇතුළත් නොවේ, වට්ටම් කළ අපනයන බිල්පත් වල වටිනාකම විදේශීය බැංකු වත්කම් යටතේ දක්වා ඇත.

පළමුවැනි කාර්තුවේ දී මුදල් සැපැයුම සුළු වශයෙන් පහත වැටුනේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සැහෙන පමණ වැඩිවීමක හා විශාල විදේශීය ගෙවුම් හිඟයක ප්‍රතිඵලයක් වශයෙනි. බැංකු ක්‍රමය සමග කෙරුණු රජයේ ගනුදෙනු හා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයට දෙනු ලැබූ දළ වෙළෙඳ බැංකු ණය සැලකිය යුතු අන්දමින් වැඩිවීමෙන් ඉහත සඳහන් වූ සංකෝචනාත්මක බලපෑම් මුළුමනින් ම පාහේ මැකී ගියේ ය. දෙවැනි කාර්තුවේදී පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයට දෙනු ලැබූ බැංකු ණය පරිමාව අඛණ්ඩව වැඩිවීම ප්‍රධානතම ප්‍රසාරණාත්මක සාධකය වූ අතර, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ද අඛණ්ඩව වැඩිවීම නිසා මුදල් සැපයුමෙහි වැඩිවීම තරමක් සීමා විය. ඉහත සඳහන් සාධකයන් සුළු වශයෙන් වෙනස් වීම නිසා තුන්වැනි කාර්තුවේ දී බැංකු ණය පරිමාව වෙනස් වූ අතර, ඒ මගින් මුදල් සැපයුමෙහි සුළු පිරිහීමක් දක්නා ලදී. වසරෙහි අවසාන තුන් මාසයේ දී මුදල් සැපයුම ශීඝ්‍රයෙන් වැඩි වූයේ බැංකු ක්‍රමය සමග කෙරුණු රජයේ ගනුදෙනු හා ශුඩ විදේශීය වත්කම් වැඩි වූ නිසා ය.

පළමුවැනි කාර්තුවේ දී අති ශීඝ්‍රයෙන් පිරිහුනු ශුඩ විදේශීය බැංකු වත්කම් ඉන්පසු කාර්තුවල දී මුදල් සැපැයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළේ ය. වාණිජ බැංකු විසින් දෙන ලද දළ ණය පරිමාව වසරේ මුල් සමය තුළ දී ශීඝ්‍රයෙන් වැඩි වුව ද, අවසාන හය මාසයේ දී වැඩි වූයේ ඉතා සෙමිනි. බැංකු ක්‍රමය සමග කෙරුණු රජයේ ගනුදෙනු පළමුවැනි හා සිව්වැනි කාර්තු වල දී මුදල් සැපැයුම කෙරෙහි සැහෙන ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළාය. තුන්වැනි කාර්තුවේ දී හැර අන් කාලජෙදයන් තුළ රජයේ නොවන තැන්පතු වැඩිවී මුදල් සැපැයුම සංකෝචනය වීමට තුඩු දුනි. එසේ වුවද, තුන්වැනි කාර්තුවේදී කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු වලින් සංකෝචනය ඉතා අල්ප විය.

## 1. (ආ) පිරිවැටුම් අනුපාතික

1964 දී ඇති වූ ද්‍රවශීල වත්කම් වැඩිවීම 1963 දී වූ ද්‍රවශීලතා වර්ධනය තරම් නොවුවද, පෞද්ගලික අංශය සතු මුළු තැන්පතු පරිමාව (ඉල්ලුම්, කාලීන හා ඉතිරි කිරීම්) පසුගිය වසරට වඩා ශීඝ්‍රයෙන් වැඩි විය. පෞද්ගලික අංශය සතු වූ තැන්පතු වැඩිවත් ම වෙළෙඳ බැංකු වෙත තුබූ තැන්පතුවල මාසික සාමාන්‍ය පිරිවැටුම් අනුපාතික ද ඉහළ නැංගේය.

තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුවේ හා ලංකා ඉතිරි කිරීම් බැංකුවේ තුබූ තැන්පතුවල මාසික සාමාන්‍යය ඉකුත් වසරේදීට වඩා පිළිවෙලින් රුපියල් කෝටි 1·89 කින් හා රුපියල් කෝටි 0·26 කින් වැඩි විය. මේ තැන්පතුවල පිරිවැටුම් අනුපාතිකයන් පසුගිය අවුරුද්දේ පැවති මට්ටමටම, එනම්, 0·021 සහ 0·015 වශයෙන් ස්ථාවරව පැවතිනි.

1964 දී වෙළෙඳ බැංකු වෙත වූ පෞද්ගලික අංශය සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු පරිමාව මාසික සාමාන්‍යයක් වශයෙන් පසුගිය වසරට වඩා රුපියල් කෝටි 6·85 කින් වැඩි විය. මේ තැන්පතුවල පිරිවැටුම් අනුපාතිකයද 0·17 සිට 0·18 දක්වා සියයට 5·9 කින් වැඩිවිය. වෙළෙඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු පිළිබඳ තොරතුරු 1964 අප්‍රේල් මාසයේ සිට ඉදිරි නව මාසය සඳහා වෙන් වෙන්ව ලැබී ඇත. නව මසෙහි කාලීන තැන්පතුවල පිරිවැටුම් අනුපාතිකය 0·23 ක්වූ අතර, ඉතිරි කිරීම් තැන්පතුවල පිරිවැටුම් අනුපාතිකය 0·10 ක් විය. මේ අනුව, වෙළෙඳ බැංකු වෙත වූ ඉතිරි කිරීම් තැන්පතුවල පිරිවැටුම් අනුපාතිකය, තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුවේ වූ ඉතිරි කිරීම් තැන්පතුවල පිරිවැටුම් අනුපාතිකය මෙන් පස් ගුණයක් වූ බැව් පෙනේ.

වර්ෂාවසාන සංඛ්‍යා තොරතුරු අනුව රාජ්‍ය නොවන අංශය සතු ඉල්ලුම් තැන්පතු වසර තුළ රුපියල් කෝටි 9·13 කින් හෙවත් සියයට 13·5 කින් වැඩි වූ බැව් පෙනේ. එසේ වුවද, ඉල්ලුම් තැන්පතු වල මාසික සාමාන්‍යය පසුගිය වසරේ පැවති මට්ටමට වඩා වැඩි වූයේ රුපියල් කෝටි 4·55 කින් හෙවත් සියයට 6·9 කිනි. 1963 දී සියයට 5·0 කින් පිරිහුනු ඉල්ලුම් තැන්පතු වල සාමාන්‍ය මාසික පිරිවැටුම් අනුපාතිකය ද 1964 දී සියයට 5·8 කින් 1·72 සිට 1·82 දක්වා වැඩිවිය. සමාලෝචිත වසර තුළ ඉල්ලුම් තැන්පතු පිරිවැටුම් අනුපාතිකය ඉහළ යාම වැදගත් වන්නේ මුදල් සැපයුමට ඇතුලත්වන ඉල්ලුම් තැන්පතු පරිමාව 1963 දීට වඩා 1964 දී ශීඝ්‍රයෙන් වැඩි වූ නිසාය. මුදල් සැපයුමෙහි-එනම් මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු සහ ව්‍යවහාර මුදල් වල මාසික සාමාන්‍යය ද 1963 දීට වඩා රුපියල් කෝටි 10·0 කින් හෙවත් සියයට 6·9 කින් ඉහළ ගියේය. මුදල් වල ආදායම් ප්‍රවේගය ද (එනම් පවත්නා සාධක මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිතය මුදල් සැපයුමෙහි සාමාන්‍යයෙන් බෙදූ විට) 1964 දී 4·65 සිට 4·61 දක්වා අඩු විය.

## I (ඇ) කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු

පෞද්ගලික අංශය සතු වූ මුළු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු පරිමාව[1] 1964 දී රුපියල් කෝටි 7·25 කින් හෙවත් සියයට 17·9 කින් රුපියල් කෝටි 99·32 දක්වා වැඩි විය. මේ තැන්පතු ඉකුත් අවුරුද්දේ දී වැඩි වූයේ රුපියල් කෝටි 7·84 කින් හෙවත් සියයට 9·3 කිනි. පෞද්ගලික අංශය සතු මුළු ද්‍රවශීල වත්කම් කෙරෙහි වූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු අනුපාතය සියයට 31·2 (1963) සිට සියයට 30·9 (1964) දක්වා සුළු වශයෙන් පහළ වැටිනි.

පෞද්ගලික අංශය සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවූයේ බෙහෙවින් ම වෙළෙඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 5·25 කින් වැඩිවීම නිසාය. වෙළෙඳ බැංකු වෙත වූ පෞද්ගලික අංශය සතු කාලීන තැන්පතු රුපියල් කෝටි 2·42 කින් ද, ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 2·83 කින් ද වැඩි විය. තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව සහ ලංකා ඉතිරි කිරීම් බැංකුව වෙත වූ ඉතිරි කිරීම් තැන්පතු ද පිළිවෙළින් රුපියල් කෝටි 1·79 කින් හෙවත් සියයට 4·8 කින් ද රුපියල් කෝටි 0·21 කින් හෙවත් සියයට 2·7 කින් ද වැඩි විය.

ඉකුත් පස් අවුරුදු කාලය තුළ වෙළෙඳ බැංකු වෙත වූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු පිළිබඳ සංඛ්‍යා තොරතුරු පහත එන සංඛ්‍යා සටහනෙන් දක්වේ.

සංඛ්‍යා සටහන II (ඉ) 9

**වෙළෙඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු**

**( පසුගිය පස් අවුරුද්ද තුළ )**

රුපියල් දශ ලක්ෂ

| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | වෙනස 60 / 61 | වෙනස 61 / 62 | වෙනස 62 / 63 | වෙනස 63 / 64 |
|---|---|---|---|---|---|---|---|---|---|
| කාලීන තැන්පතු * .. | 243·2 | 233·1 | 285·5 | 334·0 | 357·6 | —10·1 | +52·4 | +48·5 | +23·6 |
| ඉතිරි කිරීම් තැන්පතු .. | 129·0 | 130·6 | 140·9 | 165·2 | 193·5 | + 1·6 | +10·3 | +24·3 | +28·3 |
| එකතුව .. | 372·2 | 363·8 | 426·4 | 499·2 | 551·1 | — 8·5 | +62 6 | +72·8 | +51·9 |

ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* මෙහි දක්වෙන කාලීන තැන්පතුවලට රජය සතු කාලීන තැන්පතුද අයත් වේ. 1964 දෙසැම්බර් 31 වැනි ද රජය සතු කාලීන තැන්තතු රුපියල් කෝටි 3·06 ක් විය.

1961 – 1964 දක්වා තුන් අවුරුදු කාලය තුළ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ශීඝ්‍රයෙන් වැඩි වූ බැව් පෙනේ. මහ බැංකුවට ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව 1963 දෙසැම්බර් අවසානයේ දී කාලීන තැන්පතු වලින් සියයට 63 ක් පමණ බැංකු නොවන මූල්‍ය සංස්ථා, වතුකාර සමාගම්, වෙළෙඳ ආයතන ආදියෙන් සමන්විත වූ

1. එනම්, තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව හා ලංකා ඉතිරි කිරීම් බැංකුව වෙතැති තැන්පතු හා වෙළෙඳ බැංකු වෙතැති, රජයේ සමායතන, සමූපකාර ආයතන හා පෞද්ගලික අංශයට ගැනෙන අනෙකුත් අය සතුවූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වේ.

ව්‍යාපාරික අංශය සතු වූ බැව් පෙනේ. කාලීන තැන්පතු ගිණුමක සාමාන්‍ය ප්‍රමාණය රුපියල් 43,605/-ක් විය. අනික් අතට, ඉතිරි කිරීම් තැන්පතු මුළුමනින්ම පාහේ පුද්ගලයින් සතු ඒවා වූහ. මේ තැන්පතු වල සාමාන්‍ය ප්‍රමාණය 1963 දෙසැම්බර් මාසයේ දී රුපියල් 1,316 විය.[1]

ඉකුත් තුන් අවුරුද්ද තුළ දී, වෙළෙඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වේගයෙන් වැඩිවීම, මුදල් පාලනය අතින් වැදගත් වෙයි. කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ශීඝ්‍රයෙන් වැඩිවීමත් සමගම ඒවායේ පිරිවැටුම් අනුපාතිකය ද ඉහළයාම ගැන 1963 වාර්ෂික වාර්තාවෙන් අවධාන යොමු කරන ලදී. මේ වැඩිවීම වඩාත් වැදගත් වන්නේ, දැනට මුදල් සැපයුමට දී ඇති අර්ථ නිරූපනය අනුව මහජනයා සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු මුදල් සැපයුමට අයත් නොවන හෙයිනි. ණය මුදල් පාලනය අතින්ද එය වැදගත්ය. මහ බැංකුවේ සංචිත අවශ්‍යතා අණුව, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සම්බන්ධයෙන් ඉල්ලුම් තැන්පතු වලට [2] සහ [3] වඩා වෙනස් අනුපාතික පනවනු ලැබේ.

## (ඇ) රජයේ ණයපත්

II ඉ- I සංඛ්‍යා සටහනේ දක් වූ පරිදි පෞද්ගලික අංශය සතු වූ රජයේ ණය පත් පරිමාව 1964 දී රුපියල් කෝටි 5·91 කින් හෙවත් සියයට 13·2 කින් රුපියල් කෝටි 50·57 දක්වා වැඩිවිය. පෞද්ගලික අංශය සතු වූ රජයේ ණයපත් පරිමාව, පෞද්ගලික අංශය සතු වූ ද්විතියික ද්‍රවශීල වත්කම්වල ප්‍රතිශතයක් වශයෙන් ගත්කල සියයට 30·9 (1963) සිට සියයට 31·7 (1964) දක්වා ඉහළ නැංගේය. පෞද්ගලික අංශය සතු මුළු ද්‍රවශීල වත්කම්වල ප්‍රතිශතයක් වශයෙන් ද රජයේ ණයපත් පරිමාව සියයට 15·1 සිට සියයට 15·7 දක්වා වැඩිවිය.

මීට කලින් රට තුල ද්‍රවශීලතාව වැඩි වූ අන්දම විග්‍රහ කිරීමේ දී, රජයේ ණයපත් වැඩිවීම හිමිකාර ගණයන් අතර බෙදී ගිය අයුරු II ඉ 2 සංඛ්‍යා සටහනෙන් දක්වන ලදී. පෞද්ගලික අංශය සතු වූ රජයේ ණයපත් රුපියල් කෝටි 5·91 කින් වැඩිවීමෙන් බෙහෙවින්ම පිළිබිඹු වූයේ අලුතින් නිකුත් කරන ලද ණයපත් ගැනීමකි.

ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව සතු වූ රජයේ ණයපත් රුපියල් කෝටි 3·51 කින් ද, පෞද්ගලික රක්‍ෂණ සමාගම් සතු වූ ණයපත් රුපියල් කෝටි 0·49 කින්ද වැඩිවිය. භාරකාර මණ්ඩල සුභ සාධක මණ්ඩල, විශ්‍රාම වැටුප් සහ අර්ථ සාධක අරමුදල්[4] සතු වූ රජයේ ණයපත් ද වසර තුළ රුපියල් කෝටි 1·68 කින් වැඩි වූ බැව් පෙනේ.

## (ඉ) පොළී අනුපාතික

තැපැල් කන්තෝරු ඉතිරිකිරීම් බැංකුව වෙත වූ ඉතිරිකිරීම් තැන්පතු සඳහා ගෙවන පොළී අනුපාතිකය 1964 ජනවාරි 1 වැනිදා සිට සියයට 2·4 දක්වා වැඩිකරන ලදී. මේ වෙනස හැරුනු විට අනෙකුත් තැන්පතු සඳහා ගෙවෙන අනුපාතිකයන් නොවෙනස්ව පැවතින.

---

(1) මේ පිළිබඳ වැඩිපුර තොරතුරු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1964 මැයි මාසය වෙනුවෙන් නිකුත් කෙරුණු විවරණිකාවේ '1956—63 බැංකු තැන්පතු පිළිබඳ අධ්‍යයනයක්' යන ශීර්ෂය යටතේ, පළ වූ ලිපියෙහි සඳහන්වේ.

(2) දැනට පවත්නා සංචිත අනුපාතිකයන් පහත සඳහන් වේ.
සාමාන්‍ය සංචිත අනුපාතිකයන් (අ) ඉල්ලුම් තැන්පතු පිළිබඳව සියයට 12 යි.
(ආ) කාලින හා ඉතිරි කිරීම් තැන්පතු පිළිබඳව සියයට 5 යි.
විශේෂ සංචිත අනුපාතිකයන් — 1961 පෙබරවාරි මස 10 වැනිද පැවති මට්ටමට වඩා ඉල්ලුම් තැන්පතු වැඩි වූයේ නම්, එසේ වැඩි වූ ඉල්ලුම් තැන්පතු වලින් සියයට 38·0 කි.

(3) 1950 දී මුළු තැන්පතු වල අනුපාතයක් වශයෙන් ඉල්ලුම් තැන්පතු සියයට 88·9 ක්ව පැවතින 1956 සැප්තැම්බර් මාසයේ දී සියයට 78·1 ක් වූ ඉල්ලුම් තැන්පතු අනුපාතය, 1963 දෙසැම්බර් මාසයේ දී සියයට 58·9 දක්වා කෙමෙන් පිරිහින.
(1956—63 බැංකු තැන්පතු පිළිබඳ අධ්‍යයනයක්—ශ්‍රී ලංකා මහ බැංකු විවරණිකාව මැයි 1964)

(4) සේවක අර්ථ සාධක අරමුදල මීට ඇතුලත් නොවේ.

1964 අප්‍රියෙල් – අගෝස්තු අතර කාලච්ඡේදය තුල දී වාණිජ බැංකු ණය පිළිබඳව අය කෙරුණු අවම පොලී අනුපාතිකයන් සාමාන්‍යයෙන් වැඩි වූ බැව් පෙනේ. මීට කලින් සමහර බැංකු විසින් තම අවම පොලී අනුපාතිකයන් වැඩි කරන ලදී. මේ අනුව පොලී අනුපාතිකය වැඩි වීම සාමාන්‍ය දෙයක් විය. බඩ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් ඇපයට තබාගෙන දෙනු ලැබූ ණය පිළිබඳව අය කෙරුණු අවම පොලී අනුපාතිකය 1964 අප්‍රියෙල් මාසයේදී සියයට 5 සිට සියයට 6½ දක්වා වැඩිවිය. රජයේ සුරැකුම් පත් ඇපයට තබාගෙන දුන් ණය පිළිබඳව හා මිලයට ගත් බිල්පත් හා වට්ටම් කල බිල්පත් පිළිබඳව වූ අවම පොලී අනුපාතිකද පිළිවෙලින් සියයට 3½ සිට 4½ දක්වාද, සියයට 3¾ සිට 4½ දක්වාද වැඩිවිය. එසේ වුවද මිශ්‍ර සුරැකුම් පත් ඇප කල ණය පිළිබඳව වූ අවම පොලී අනුපාතිකය අගෝස්තු මාසයේ දී සියයට 5 සිට සියයට 4½ දක්වා අඩු විය.

වෙළෙඳ බැංකුවල සමහර අත්තිකාරම් වගී පිළිබඳව අය කෙරුනු උපරිම පොලී අනුපාතිකයන් ද වසර තුල වැඩි වූ බැව් පෙනේ. අප්‍රියෙල් මාසයේ දී මිශ්‍ර සුරැකුම් පත් ඇප කොට හා කිසිම ඇපයක් නැතිව, දෙනු ලැබූ අත්තිකාරම් පිළිබඳව වූ ණය අනුපාතිකයන් සියයට 8 සිට 9 දක්වා වැඩි විය.

1964 අගෝස්තු 1 වැනිදා සිට මහ බැංකුව විසින් රජයෙන් භාණ්ඩාගාර බිල් මිලට ගන්නා අනුපාතිකය ද, සියයට 2·80 සිට සියයට 0·76 දක්වා අඩු කරන ලදී. මෙය මුදල් වෙළෙඳ පොලේ ඇතිවූ වෙනසක ප්‍රතිඵලයක් නොව, ජාතික ණය වෙනුවෙන් පොලී ගෙවීම නිසා, රජයට සිදුවන පොලී බර අඩුකිරීමට ගත් උත්සාහයක් පමණි.

## 2. වෙළෙඳ බැංකු කටයුතු.

1964 දී පෞද්ගලික අංශයට දුන් රු. කෝටි 9·20 ක බැංකු ණය ව්‍යාප්තිය ප්‍රමාණාත්මකව විශාල වුවද, අවුරුද්දේ තරම් නොවිය. 1964 දී බැංකු ශාඛා ක්‍රමය විහිදුවීමෙහි ලා ක්‍රියාශීලී වූයේ මහජන බංකුව පමණි. ලංකා බැංකුව විසින් අලුතින් බැංකු ශාඛා නොපිහිටු වුවද, වසර තුල මහජන බැකුවේ ණය වැඩිවූ තරමින්ම පාහේ ලංකා බැංකුව විසින් පෞද්ගලික අංශයට දුන් ණයද වැඩි විය. මීට වෙනස්ව, විදේශීය බැංකු විසින් දෙනු ලැබූ ණය 1962 දෙසැම්බර් මාසයේදී පැවති මට්ටම දක්වා අඩුවිය.

### 2. (අ) බැංකු ශාඛාවන්

1962–1964 කාලච්ඡේදය තුල බැංකු කාර්යාල විහිදී ඇති අන්දම, ලාංකික බ්‍රිතාන්‍ය ඉන්දියානු සහ පකිස්ථානු බැංකු අතර මුළු තැන්පතු පරිමාව බෙදී ගොස් ඇති අන්දමද පහත එන II ඉ – 10 දරන සංඛ්‍යා සටහනෙහි දක්වේ.

සංඛ්‍යා සටහන II (ඉ) 10.

**බැංකු කාර්යාල සහ තැන්පතු බෙදී ගිය අන්දම 1962–1964.**

| | එකතුව | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දියානු සහ පාකිස්ථානු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | |
| | | ප්‍රමාණය රුපියල් ලක්ෂ | % | | ප්‍රමාණය රුපියල් ලක්ෂ | % | | ප්‍රමාණය රුපියල් ලක්ෂ | % | | ප්‍රමාණය රුපියල් ලක්ෂ | % |
| 1962 | 73 | 1,182 | 100 | 57 | 683 | 58 | 12 | 429 | 36 | 4 | 70 | 6 |
| 1963 | 83 | 1,301 | 100 | 67 | 801 | 61 | 12 | 412 | 32 | 4 | 88 | 7 |
| 1964 | 88 | 1,447 | 100 | 72 | 943 | 65 | 12 | 415 | 29 | 4 | 90 | 6 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1964 වසර තුළ බන්ඩාරවෙල, කළුතර, රාගල, තලවකැලේ සහ වවුනියාව යන ප්‍රදේශවල අලුතින් බැංකු කාර්යාල පහක් විවෘත කරන ලදී. මේ කාර්යාල සියල්ලම මහජන බැංකුවේ ශාඛාවන් වූහ. නව බැංකු කාර්යාල පහෙන් හතරක් එතෙක් බැංකුපහසුකම් නොතිබූ නගරවල පිහිටුවන ලදී.

1960 දී 46 ක්ව පැවති, දිවයිනෙහි ඇති මුළු බැංකු කාර්යාලය ගණන, 1964 අවසානයේදී 88 දක්වා වැඩිවී ඇති බැව් පෙනේ. මෙයින් කාර්යාල 72 ක්ම ලාංකික බැංකු කාර්යාල වූ අතර, කාර්යාල 62 ක් කොළඹින් පිට පිහිටි ඒවා වූහ. කොළඹින් පිට පිහිටා ඇති බැංකු කාර්යාල 62 න් 56ක් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ශාඛාවන් වූහ. කොළඹින් පිට පිහිටා ඇති බැංකු කාර්යාලය සංඛ්‍යාව කොතරම් සීඝ්‍රයෙන් වැඩිවී ඇත්දැයි පෙනී යන්නේ 1960 දී කොළඹින් පිට පිහිටියේ බැංකු කාර්යාල 26 පමණක්වූ බව සළකන විටය.

II (ආ) මූල්‍ය සම්පත්, ඒවා ලැබුන අයුරු හා යෙදවූ අයුරු.

1961 සහ 1964 අතර කාලච්ඡේදය තුළදී, වාණිජ බැංකු සතුවූ මූල්‍ය සම්පත් වෙනස් වූ අයුරු හා එම සම්පත් යෙද වූ අයුරු පහත එන II ඉ - 11 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

සංඛ්‍යා සටහන II (ඉ) 11

**1961 / 64 බැංකු සම්පත් වෙනස් වූ අයුරු සහ ඒවා යෙදවූ අයුරු**

රුපියල් දශ ලක්ෂ

| | 1961 | 1962 | 1963 | 1964 |
|---|---|---|---|---|
| **මුදල් ලැබුණු මාර්ග** | | | | |
| **1. රාජ්‍ය අංශය** .. .. .. .. | — | **84·8** | **14·8** | **28·7** |
| ණය වැඩිවීම .. .. .. .. | — | 5·0 | — | — |
| රජයේ සුරැකුම්පත් අඩුවීම .. .. .. | — | — | 5·5 | — |
| තැන්පතු වැඩිවීම .. .. .. .. | — | 79·8 | 9·3 | 2·9 |
| කෙටි කාලීන වත්කම් අඩුවීම .. .. | — | — | — | 25·8 |
| **2. මහ බැංකුවෙන් ණය ගැනීම වැඩිවීම** | — | — | **37·9** | — |
| **3. දේශීය පෞද්ගලික අංශය** .. .. | **80·0** | **125·0** | **115·3** | **154·9** |
| තැන්පතු වැඩිවීම .. .. .. .. | — | 82·4 | 109·9 | 143·8 |
| සංචිත හා ගෙවනලද ප්‍රාග්ධන ආදිය වැඩිවීම .. .. .. .. | 8·8 | 7·5 | 5·4 | 4·4 |
| අනෙකුත් වගකීම් වැඩිවීම .. .. | 71·2 | — | — | — |
| අනෙකුත් වත්කම් අඩුවීම .. .. | — | 35·1 | — | 6·7 |
| **4. විදේශීය අංශය** .. .. .. | **10·0** | **5·6** | **8·2** | — |
| විදේශීය ශේෂ අඩුවීම .. .. .. | 10·0 | 5·6 | 8·2 | — |
| **5. දේශීය මුදල් ශීර්ෂ අඩුවීම** .. .. | **35·4** | — | **1·1** | — |
| සම්පත්වල මුළු වැඩිවීම .. .. .. | 125·4 | 215·4 | 177·3 | 183·6 |
| **මුදල් යෙදවූ අයුරු** | | | | |
| **1. රාජ්‍ය අංශය** .. .. .. | **35·5** | **71·4** | **25·8** | **5·4** |
| ණය අඩුවීම .. .. .. .. | 2·0 | — | — | 5·0 |
| රජයේ සුරැකුම්පත් වැඩිවීම .. .. | 21·4 | 71·4 | — | 0·4 |
| තැන්පතු අස්කර ගැනීම .. .. .. | 12·1 | — | — | — |
| ණයට දෙනු ලැබූ කෙටි කාලීන ණය වැඩිවීම | — | — | 25·8 | — |
| **2. මහ බැංකු ණය අඩුවීම** .. .. .. | **0·4** | **20·6** | — | **18·8** |
| **3. දේශීය පෞද්ගලික අංශය** .. .. | **89·4** | **88·1** | **150·4** | **93·1** |
| තැන්පතු අස්කර ගැනීම .. .. .. | 21·2 | — | — | — |
| අත්තිකාරම් වැඩිවීම .. .. .. | 19·0 | 41·2 | 136·9 | 92·0 |
| අනෙකුත් වගකීම් අඩුවීම .. .. | — | 46·9 | 1·5 | 1·1 |
| අනෙකුත් වත්කම් වැඩිවීම .. .. | 49·2 | — | 12·0 | — |
| **4. විදේශීය අංශය** .. .. .. | **2·9** | **4·2** | **1·3** | **22·1** |
| ණය අඩුවීම .. .. .. .. | 0·6 | 3·5 | 0·6 | 0·8 |
| තැන්පතු අස්කර ගැනීම .. .. .. | 2·3 | 0·7 | 0·7 | 0·1 |
| විදේශීය ශේෂ වැඩිවීම .. .. .. | — | — | — | 21·2 |
| **5. දේශීය මුදල් ශීර්ෂ වැඩිවීම** .. .. | — | **30·6** | — | **43·7** |
| යෙදවූ සම්පත්වල මුළු වැඩිවීම .. .. | 128·2 | 214·9 | 177·5 | 183·1 |

සංඛ්‍යා – ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

වානිජ බැංකු වලට ලැබෙන කාරක සම්පත් 1964 දී රුපියල් කෝටි 18·36 කින් වැඩිවූ බැව් පෙනේ. මේ වැඩිවීම ඉකුත් වසරේදී ඇතිවූ වැඩිවීමට වඩා මඳක් විශාල විය. මෙයින් රු. කෝටි 14·38 ක් පෞද්ගලික අංශය සතුවූ තැන්පතු වැඩිවීමේ ප්‍රතිඵලය විය. බැංකු සතු වූ විවිධ මිශ්‍ර වත්කම් - එනම් අනිකුත් වත්කම් - රුපියල් කෝටි 0·67 කින් පිරිහින. වසර තුල රජයේ තැන්පතු වැඩිවූයේ ඉතා සුළු වශයෙනි. 1963 දෙසැම්බර් මාසයේදී රජයට දෙනු ලැබූ කෙටිකාලීන ණය පියවීම නිසා වාණිජ බැංකු සතුවූ කාරක සම්පත්වලට රාජ්‍ය අංශයෙන් සැහෙන මුදලක් එකතු විය.

මේ සම්පත් වලින් වැඩි කොටස - එනම් රු. කෝටි 9·20ක්-බැංකු විසින් පෞද්ගලික අංශයට ණයදීම සඳහා උපයෝගී කරගනු ලැබිය. තවත් රුපියල් කෝටි 4·37 ක් තම දේශිය මුදල් සංචිතයන් තරකර ගැනීම සඳහාද, රුපියල් කෝටි 2·21 ක් විදේශිය කාරක මුදල් ශේෂයන් වැඩිකර ගැනීම සඳහාද යොදවන ලදී. පසුගිය අවුරුද්දේ මහ බැංකුවට විශාල මුදලක් ණය ගැනිවූ වාණිජ බැංකු 1964 දී වැඩිවූ සම්පත් වලින් රුපියල් කෝටි 18.8 ක් මහ බැංකුවට අයවිය යුතු ණය බේරීම සඳහාද යෙදූහ.

2 (ඈ) බැංකු වගකීම් සැකසුම:

II ඉ - 12 සංඛ්‍යා සටහනෙහි 1953 සිට 1964 දක්වා කාලය තුල බැංකු ක්‍රමය සතු වත්කම් හා වගකීම් බෙදීයාම පිළිබඳ විස්තර දක්වා ඇත.

1963 දී රු. කෝටි 14·88 කින් හෙවත් සියයට 10.8 කින් වැඩිවූ වාණිජ බැංකුවල මුළු වගකීම්, 1964 දී රුපියල් කෝටි 13·00 කින් හෙවත් සියයට 8·5 කින් රුපියල් කෝටි 152·84 සිට රුපියල් කෝටි 165·84 දක්වා වැඩිවී ඇත. මුළු වගකීම් වැඩිවීම, බෙහෙවින්ම තැන්පතු වගකීම් රු. කෝටි 14·62 කින් වැඩිවීම නිසා සිදුවූවක් විය. එහෙත් වෙළෙඳ බැංකු විසින් පිළිවෙළින් රුපියල් කෝටි 1·88 කින් හා රුපියල් කෝටි 0·5 කින් මහ බැංකුවට හා රජයට අය විය යුතු වූ ණය බේරීම නිසා තැන්පතු වැඩිවීම ආශ්‍රිතව ඇතිවූ වගකීම් වැඩිවීම මඳක් මැකීගියේය. 1964 දී මුළු තැන්පතු වැඩිවීමත් සමගම, මුළු වගකීම්වලට වූ තැන්පතු අනුපාතය සියයට 85·1 සිට සියයට 87·3 දක්වා ඉහල නැංගේය.

සෑම මාර්ගයකින්ම වාණිජ බැංකු ලද තැන්පතු 1964 දී රුපියල් කෝටි 14·62 කින් හෙවත් සියයට 11·2 කින් රුපියල් කෝටි 144·75 දක්වා වැඩිවිය. වසර තුල තැන්පතු වැඩිවූ ආකාරය ඉකුත් වසරේදීට වඩා වෙනස් විය. 1963 දී ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 4·6 කින් වැඩිවූ අතර, කාලීන හා ඉතිරි කිරීම් තැන්-පතු ඊටත් වඩා ශීඝ්‍රයෙන් රුපියල් කෝටි 7·28 කින් වැඩිවිය. එහෙත් 1964 දී කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවූයේ ඉල්ලුම් තැන්පතු වැඩිවූ වේගයට වඩා සෙමිනි. ඉල්ලුම් තැන්පතු රු. කෝටි 9·43 කින් රු. කෝටි 80·21 සිට රුපියල් කෝටි 89·64 දක්වා වැඩි වුවද කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවූයේ රුපියල් කෝටි 55·11 දක්වා රුපියල් කෝටි 5·19 කිනි. කලක් තිස්සේ මුළු තැන්පතු පරිමා-වෙහි වූ කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු සාපේක්ෂිතව වැඩිවීමෙන්, තැන්පතු සංයුතිය වෙනස් වෙමින් පැවතින. එහෙත් වසර තුල ඉල්ලුම් තැන්පතු ශීඝ්‍රයෙන් වැඩිවීම නිසා කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු අනුපාතය මෙසේ ක්‍රමයෙන් ඉහළයාම තාවකාලිකව නැවතින. 1963 දී සියයට 61·6 ක්වූ මුළු තැන්පතු වලට වූ ඉල්ලුම් තැන්පතු අනුපාතය, 1964 දී සියයට 61.9 දක්වා වැඩි විය. තවද, වෙළෙඳ බැංකු ලද තැන්පතු මුළුමණින්ම පාහේ රාජ්‍යාංශයෙන් නොව අනිකුත් මාර්ගයන්ගෙන් ආ ඒවා වූහ. වාණිජ බැංකු වෙතවූ රජයේ තැන්පතු වැඩිවූයේ රුපියල් කෝටි 0·29 කින්, අල්ප වශයෙනි. වාණිජ බැංකු වෙතැති මුළු තැන්පතු වලට වූ රජයේ තැන්පතු අනුපාතය 1964 දී සියයට 12·1 සිට සියයට 11·1 දක්වා අඩුවිය

1964 දී වැඩිවූ වාණිජ බැංකු තැන්පතු මුළුමණින්ම පාහේ ලැබුනේ ලාංකික බැංකුවලට බව බැංකු ශාඛා යන ශීර්ෂය යටතේ එන 11 ඉ-10 සංඛ්‍යා සටහනෙන් පෙනේ. මුළු තැන්පතු රුපියල් කෝටි 14·6 කින් වැඩිවූ අතර, එයින් රුපියල් කෝටි 14·2 ක්ම ලාංකික බැංකු සතුවිය.[1] (මේ තැන්පතු වැඩිවීම ලංකා බැංකුව සහ මහජන බැංකුව අතර සමසේ බෙදී ගියේය.) විදේශිය බැංකු සතු තැන්පතු වැඩිවූයේ රුපියල් කෝටි 0·5 කිනි. සාමාන්‍යයෙන් වැඩිවෙන මුදල් සැපයුමෙන් සැහෙන කොටසක් නැවත බැංකු ක්‍රමය කරා ගලා ඒමට බැංකු පහසුකම් වැඩිවීම උපකාරී වන බැව් පෙනේ.

පහත එන II ඉ-13 සටහනෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පැවැත්වෙන අර්ධ වාර්ෂික සමීක්ෂණයන්ගෙන් හෙළිවන පරිදි, වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශය සතුවූ තැන්පතු විවිධ හිමිකාර ගණයන් අතර බෙදීගිය අයුරු විග්‍රහ කෙරේ. 1964 දී වැවිලි හැර අනිකුත් සෑම හිමිකාර ගණයක්ම සතුවූ තැන්පතු වැඩිවූ බැව් පෙනේ. ඉකුත් අවුරුද්ද තුළ වැඩිවූ තැන්පතුවලින් වැඩි කොටස වෙළෙඳ ආයතනයන්ට ලැබුනි. එහෙත් 1964 දී තැන්පතු වැඩිවීම බෙහෙවින්ම පුද්ගලයන්ට හිමිවිය. වැඩිවූ තැන්පතුවලින් රුපියල් කෝටි 8·1 ක් හෙවත් සියයට 68 ක් පුද්ගලයින් සතුවිය. වෙළෙඳ ආයතන, අනිකුත් ව්‍යාපාර සහ ව්‍යාපාර නොවන සංස්ථාවන් සතුවූ තැන්පතුද සැහෙන පමණ වැඩිවිය. ඉකුත් කාලච්ඡේද-යන්හිදී පිරිහෙමින් පැවති වැවිලි සමාගම් සතු තැන්පතු 1964 දී වඩාත් පිරිහින. පෞද්ගලික අංශය සතුවූ මුළු තැන්පතු පරිමාවෙහි අනුපාතයක් වශයෙන් වැවිලි සමාගම් සතු තැන්පතු 1963 දී සියයට 10·3 ක්ව තිබී 1964 දී සියයට 8·0 දක්වා අඩුවිය.

2. (ඈ) **බැංකු වත්කම් සැකැසුම**

II ඉ - 12 සංඛ්‍යා සටහනෙන් වාණිජ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු දක්වේ.

වාණිජ බැංකු සතු වත්කම් රුපියල් කෝටි 13·0 කින් වැඩිවීම බෙහෙවින්ම ලෝන සහ අයිරාවන් රුපියල් කෝටි 10·68 කින් හෙවත් සියයට 19·6 කින් වැඩිවීම නිසා සිදුවූවකි. වෙළෙඳ බැංකු සතු වූ දීගුකාලීන රජයේ සුරැකුම්පත් ද රුපියල් කෝටි 1·09 කින් හෙවත් සියයට 8·4 කින් වැඩිවිය. විදේශීය ශේෂයන් හා මුදල් වත්කම්ද පිළිවෙලින් රුපියල් කෝටි 2·12 කින් හා රුපියල් කෝටි 4·37 කින් වැඩිවිය. එසේ වුවද, 1964 දී වාණිජ බැංකු සතුවූ භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 1.05 කින්ද වාණිජ බිල්පත් හා අනෙකුත් කෙටි කාලීන වත්කම් රුපියල් කෝටි 3·3 කින්ද අඩු වූයේය.

1964 දී වාණිජ බැංකු සතුවූ මුළු ද්‍රවශීල වත්කම් තරමක් වැඩිවුවද, මුළු තැන්පතු පරිමාවෙහි අනුපාතයක් වශයෙන් ද්‍රවශීල වත්කම් සියයට 36·2 සිට සියයට 34·1 දක්වා පහත වැටින. මුළු තැන්පතුවලට වූ බිල්පත් (වාණිජ බිල්පත් හා භාණ්ඩාගාර බිල්පත්) අනුපාතය ද සියයට 20·6 සිට සියයට 15·5 තෙක් අඩු විය. එහෙත් ද්‍රවශීල වත්කම් පරිමාවෙහි අඩංගු වූ මුදල් වත්කම් අනුපාතය සියයට 13·1 සිට සියයට 14·8 දක්වා වැඩිවූ අතර, මුළු තැන්පතුවලට වූ ලෝන සහ අයිරා අනුපාතය සියයට 41·9 සිට සියයට 45·1 දක්වා සැලකිය යුතු අන්දමින් වැඩිවිය. වෙළෙඳ බැංකු සතුවූ දිගුකාලීන රජයේ සුරැකුම්පත් පරිමාව වැඩිවුවද මුළු තැන්පතුවලට වූ ආයෝජන අනුපාතය සියයට 24·4 සිට සියයට 22·7 දක්වා අඩු විය.

---

1. 1961 මුදල් පනත අනුව 1961 ජුලි 27 වැනිද සිට, ලාංකික පුර වැසියන්ට හා ලාංකික සමාගම්වලට අලුතින් බැංකු ගිනුම් විවෘත කළ හැක්කේ පහත සඳහන් සංස්ථාවන්හි පමණි–

ලංකා බැංකුව, මහජන බැංකුව, ලංකා ඉතිරිකිරීම් බැංකුව, ලංකා තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව හෝ සමුපකාර සමිති පනත යටතේ සමිතියක් වශයෙන් ලියා පදිංචි කළ ඕනෑම බැංකුවක්

සංඛ්‍යා සටහන II (ඉ) 12

## වෙළඳ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු

(මාසික සංඛ්‍යා සාමාන්‍යය)

රුපියල් දශ ලක්ෂ

| | 1953 | 1954 | 1955 | 1956 | 1957 | 1958 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | කාලච්ඡේදය අවසානයේදී | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | දෙසැ. 1963 | දෙසැ. 1964 |
| අතැති මුදල් හා මහා බැංකුවේ ඇති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළුව) .. | 128 | 106 | 149 | 148 | 139 | 119 | 116 | 132 | 148 | 186 | 164 | 182 | 170 | 214 |
| විදේශීය ශේෂ .. | 44 | 55 | 112 | 116 | 72 | 50 | 52 | 58 | 54 | 55 | 44 | 49 | 32 | 54 |
| භාණ්ඩාගාර බිල් .. | 55 | 60 | 51 | 39 | 34 | 16 | 24 | 28 | 51 | 89 | 128 | 73 | 104 | 94 |
| වට්ටම් කළ බිල් හා අනෙකුත් කෙටිකාලීන වත්කම් | 65 | 73 | 94 | 93 | 100 | 116 | 119 | 115 | 122 | 136 | 114 | 126 | 164 | 131 |
| මුළු ද්‍රවශීල වත්කම් .. | 292 | 294 | 406 | 396 | 345 | 301 | 311 | 333 | 375 | 466 | 450 | 450 | 471 | 493 |
| මුළු ආයෝජන (1) .. | 235 | 221 | 245 | 291 | 308 | 296 | 285 | 284 | 290 | 303 | 313 | 330 | 318 | 329 |
| මුළු ලෝන හා අයිරාවන් .. | 182 | 208 | 244 | 273 | 340 | 363 | 395 | 430 | 435 | 477 | 495 | 633 | 545 | 652 |
| ඉල්ලුම් තැන්පතු (2) .. | 573 | 562 | 675 | 731 | 721 | 661 | 655 | 657 | 677 | 829 | 789 | 853 | 801 | 896 |
| කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු .. | 102 | 126 | 190 | 206 | 240 | 263 | 300 | 340 | 359 | 380 | 460 | 535 | 499 | 551 |
| මුළු තැන්පතු .. | 677 | 689 | 869 | 941 | 965 | 926 | 955 | 998 | 1036 | 1209 | 1250 | 1389 | 1301 | 1447 |
| අනුපාතය .. | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතුවලට වූ මුදල් .. | 22·3 | 18·9 | 22·1 | 20·2 | 19·3 | 18·0 | 17·7 | 20·1 | 21·9 | 22·4 | 20·8 | 21·3 | 21·2 | 23·9 |
| මුළු තැන්පතුවලට වූ මුදල් .. | 18·9 | 15·4 | 17·1 | 15·7 | 14·4 | 12·9 | 12·1 | 13·2 | 14·3 | 15·4 | 13·1 | 13·1 | 13·1 | 14·8 |
| මුළු තැන්පතුවලට වූ විදේශීය ශේෂ .. | 6·5 | 8·0 | 12·9 | 12·3 | 7·4 | 5·4 | 5·4 | 5·8 | 5·2 | 4·5 | 3·5 | 3·5 | 2·5 | 3·7 |
| මුළු තැන්පතුවලට වූ භාණ්ඩාගාර බිල් .. | 8·1 | 8·7 | 5·9 | 4·1 | 3·5 | 1·7 | 2·5 | 2·8 | 4·9 | 7·4 | 10·2 | 5·3 | 8·0 | 6·5 |
| මුළු තැන්පතුවලට වූ වට්ටම් කළ වාණිජ බිල් .. | 9·6 | 10·6 | 10·8 | 9·9 | 10·3 | 12·5 | 12·5 | 11·5 | 11·8 | 11·2 | 9·1 | 9·1 | 12·6 | 9·0 |
| ඉල්ලුම් තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් .. | 50·9 | 52·3 | 60·1 | 54·2 | 47·9 | 45·5 | 47·5 | 50·7 | 55·4 | 56·2 | 57·0 | 50·4 | 58·8 | 55·0 |
| මුළු තැන්පතු වලට වූ ද්‍රවශීල වත්කම් .. | 43·1 | 42·7 | 46·7 | 42·1 | 35·8 | 32·5 | 32·6 | 33·4 | 36·2 | 38·5 | 36·0 | 31·0 | 36·2 | 34·1 |
| මුළු තැන්පතුවලට වූ ආයෝජන .. | 34·7 | 32·1 | 28·2 | 30·9 | 31·7 | 32·0 | 29·8 | 28·5 | 28·0 | 25·1 | 25·0 | 23·8 | 24·4 | 22·7 |
| මුළු තැන්පතුවලට වූ ලෝන හා අයිරාවන් .. | 26·9 | 30·2 | 28·1 | 29·0 | 35·2 | 39·2 | 41·4 | 43·1 | 42·0 | 39·4 | 39·6 | 45·6 | 41·9 | 45·1 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) රජය හා රජය ඇප වූ සුකුරැම්පත් සහ මහ බැංකු නිකුතු

(1) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නැත.

සංඛ්‍යා සටහන II (ඉ) 13

## තැන්පතු හිමිකම

රුපියල් දශ ලක්ෂ

| හිමියා | ඉල්ලුම් | | කාලීන | | ඉතිරි කිරීම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| මූල්‍ය ආයතන: | | | | | | | | |
| දෙසැම්බර්, 1963 .. | 46·7 | 7·0 | 64·9 | 21·8 | 5·4 | 3·3 | 117·0 | 10·4 |
| ජූනි, 1964 .. | 49·5 | 7·1 | 65·3 | 19·7 | 6·4 | 3·6 | 121·1 | 10·1 |
| දෙසැම්බර්, 1964 .. | 41·1 | 5·7 | 71·6 | 22·0 | 8·2 | 4·2 | 120·9 | 9·7 |
| වැවිලි: | | | | | | | | |
| දෙසැම්බර්, 1963 .. | 76·3 | 11·5 | 38·8 | 13·0 | 0·7 | 0·4 | 115·8 | 10·3 |
| ජූනි, 1964 .. | 68·5 | 9·9 | 31·6 | 9·6 | 0·4 | 0·2 | 100·5 | 8·4 |
| දෙසැම්බර්, 1964 .. | 68·4 | 9·4 | 31·3 | 9·6 | 0·4 | 0·2 | 100·1 | 8·0 |
| වෙළෙඳ: | | | | | | | | |
| දෙසැම්බර, 1963 .. | 146·5 | 22·1 | 40·2 | 13·5 | 1·6 | 1·0 | 188·2 | 16·7 |
| ජූනි, 1964 .. | 127·4 | 18·4 | 51·5 | 15·6 | 2·7 | 1·5 | 181·5 | 15·1 |
| දෙසැම්බර්, 1964 .. | 166·1 | 22·8 | 37·6 | 11·6 | 3·9 | 2·0 | 207·5 | 16·7 |
| අනෙක් ව්‍යාපාර: | | | | | | | | |
| දෙසැම්බර්, 1963 .. | 72·3 | 10·9 | 45·2 | 15·1 | 4·0 | 2·4 | 121·5 | 10·8 |
| ජූනි, 1963 .. | 112·6 | 16·2 | 32·0 | 9·7 | 2·6 | 1·5 | 147·3 | 12·2 |
| දෙසැම්බර්, 1964 .. | 76·5 | 10·5 | 54·6 | 16·8 | 1·5 | 0·8 | 132·7 | 10·7 |
| ප්‍රාදේශිය බලමණ්ඩල | | | | | | | | |
| දෙසැම්බර්, 1963 .. | 29·9 | 4·5 | 17·5 | 5·9 | 0·3 | 0·2 | 47·7 | 4·2 |
| ජූනි, 1964 .. | 24·2 | 3·5 | 34·0 | 10·3 | 0·2 | 0·1 | 58·4 | 4·9 |
| දෙසැම්බර්, 1964 .. | 26·8 | 3·7 | 27·2 | 8·4 | 0·2 | 0·1 | 54·2 | 4·3 |
| ව්‍යාපාරික නොවන ආයතන: | | | | | | | | |
| දෙසැම්බර්, 1963 .. | 50·6 | 7·6 | 33·4 | 11·2 | 2·9 | 1·8 | 86·9 | 7·7 |
| ජූනි, 1964 .. | 63·4 | 9·1 | 46·2 | 14·0 | 3·3 | 1·9 | 112·9 | 9·4 |
| දෙසැම්බර්, 1964 .. | 74·8 | 10·3 | 22·5 | 6·9 | 3·4 | 1·8 | 100·7 | 8·1 |
| පුද්ගලයන්: | | | | | | | | |
| දෙසැම්බර්, 1963 .. | 240·7 | 36·3 | 58·2 | 19·5 | 149·3 | 90·9 | 448·3 | 39·8 |
| ජූනි, 1964 .. | 248·5 | 35·8 | 70·1 | 21·2 | 162·0 | 91·2 | 480·6 | 40·0 |
| දෙසැම්බර්, 1964 .. | 273·3 | 37·6 | 80·4 | 24·7 | 176·0 | 90·9 | 529·7 | 42·5 |
| එකතුව: | | | | | | | | |
| දෙසැම්බර්, 1963 .. | 662·9 | 100·0 | 298·3 | 100·0 | 164·2 | 100·0 | 1125·4 | 100·0 |
| ජූනි, 1964 .. | 694·1 | 100·0 | 330·7 | 100·0 | 177·6 | 100·0 | 1202·4 | 100·0 |
| දෙසැම්බර්, 1964 .. | 727·0 | 100·0 | 325·1 | 100·0 | 193·6 | 100·0 | 1245·8 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

### 2. (ඉ) පෞද්ගලික අංශයට දෙනු ලැබූ බැංකු ණය

පෞද්ගලික අංශයට දෙනු ලැබූ බැංකු ණය ජනවාරි මාසයේදී රුපියල් කෝටි 0·87 කින් අඩු වූ අතර, ඊළඟ සමස තුළ එනම්, ජූලි මාසය දක්වා – අඛංඩව වැඩි විය. නොවැම්බර් මාසයේ දී නැවත සුළු වැඩි වීමක් ඇති වුවද අගෝස්තු මාසයේ සිට වර්ෂාවසානය දක්වා බැංකු ණය පරිමාව පහත වැටින. ඉකුත් අවුරුද්දේ රුපියල් කෝටි 13·69 කින් වැඩි වූ පෞද්ගලික අංශයට දුන් මුළු බැංකු ණය, සමාලෝචිත වසර තුළ, රුපියල් කෝටි 9·20 කින් වැඩි විය.

### සංඛ්‍යා සටහන II ඉ - 14.

### වෙළඳ බැංකු අත්තිකාරම් - 1963 දෙසැම්බර් 1964 දෙසැම්බර්

රුපියල් දශ ලක්ෂ

| | ලාංකික බැංකු | | | විදේශීය බැංකු | | | සියලු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1963 දෙසැ. | 1964 දෙසැ. | වෙනස | 1963 දෙසැ | 1964 දෙසැ. | වෙනස | 1963 දෙසැ. | 1964 දෙසැ. | වෙනස |
| අ. එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන් ✱ | 79·6 | 73·3 | —6·3 | 2·5 | 1·2 | —1·3 | 82·1 | 74·5 | —7·6 |
| ආ. මෙරට බිල්පත් | — | — | — | ... | — | ... | ... | — | ... |
| ඇ. ආනයන බිල්පත් | 28·4 | 49·8 | +21·4 | 37·4 | 27·9 | —9·5 | 65·8 | 77·8 | +12·0 |
| ඈ අපනයන බිල්පත් | 11·1 | 13·8 | + 2·7 | 61·7 | 39·8 | —21·9 | 72·8 | 53·6 | —19·2 |
| ඉ. අයිරාවන් | 119·7 | 170·5 | +50·8 | 212 2 | 201·8 | —10·4 | 331·9 | 372·3 | +40·4 |
| ඊ. ණය | 174·6 | 226·8 | +52·2 | 38·4 | 52·6 | +14·2 | 213·0 | 279·4 | +66·4 |
| එකතුව | 413·4 | 534·2 | +120·8 | 352·2 | 323·3 | —28·9 | 765·6 | 857·6 | +92·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

✱ අය ලබා ගැනීම සඳහා යැවුනු චෙක්පත් වැනි අන්තර් බැංකු ණය, මේ ගණයෙහි අඩංගු වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. බැංකු විසින්, සහතික මිල ක්‍රමය යටතේ, ආහාර ද්‍රව්‍යයන් මිලදී ගැනීම සඳහා සමුපකාර ආයතනයන්ට දෙනු ලැබූ ඉතා කෙටිකාලීන අත්තිකාරම්ය මෙහි බෙහෙවින්ම ඇත්තේ.

ජනවාරි මාසයේ දී බැංකු ණය පරිමාව අඩු වූයේ අපනයන බිල්පත් අඩුවීමත්, සහතික මිල ක්‍රමය යටතේ ආහාර ද්‍රව්‍යයන් මිල දී ගැනීම සඳහා දුන් කෙටි කාලීන අත්තිකාරම් අඩුවීමත් නිසාය. එසේ වුවද, මැයි, ජූනි, ජූලි යන මාසයන්හි දී එනම්, මහ අස්වැන්නෙන් පසුව-සහතික මිල ක්‍රමය යටතේ දුන් කෙටි කාලීන ණය ශීඝ්‍රයෙන් වැඩි විය. මුළු වසර තුළ ආනයන බිල්පත් පරිමාව වැඩි වූ බැව් පෙනේ. මේ වැඩිවීම සැලකිය යුතු වාරික වෙනසක් නිසා ඇති වුවක් නොවිය. ලෝන සහ අයිරාවන් සාමාන්‍යයෙන් වැඩිවෙමින් පැවතින. එහෙත් අපනයන බිල්පත් පරිමාව වසරතුළ දී පිරිහිනි.

ලාංකික බැංකු විසින් පෞද්ගලික අංශයට දෙනු ලැබූ බැංකු ණය, මුළු බැංකු අත්තිකාරම් පරිමාවෙහි ප්‍රතිශතයක් වශයෙන් දැක් වූ විට, සියයට 54·0 සිට 1964 දී සියයට 62·3 දක්වා සැලකිය යුතු අන්දමින් වැඩිවිය.

### සංඛ්‍යා සටහන II (ඉ) 15

### 1964 පෞද්ගලික අංශයට දෙනු ලැබූ ලෝන සහ අයිරාවන්

රුපියල් දශ ලක්ෂ

| | 1963 දෙසැම්බර් | 1964 ජූනි | 1964 දෙසැම්බර් | 1963 දෙසැ: 1964 දෙසැ: |
|---|---|---|---|---|
| 1. පෞද්ගලික ව්‍යාපාරයන් සහ පුද්ගලයන් | 502·3 | 563·3 | 560·8 | +58·5 |
| 2. රජයේ සාමයතන | 11·2 | 17·1 | 33·8 | +22·6 |
| 3. සමුපකාර ආයතන | 31·4 | 51·8 | 57·1 | +25·7 |
| එකතුව | 544·9 | 632·2 | 651·7 | +106·8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

ඉහත එන සංඛ්‍යා සටහනෙන් වසර තුළ පෞද්ගලික ව්‍යාපාරයන්ට හා පුද්ගලයන්ට දුන් බැංකු ලෝන සහ අයිරාවන් රුපියල් කෝටි 5.85 කින්ද රජයේ සමායතනයන්ට දුන් ලෝන සහ අයිරාවන් රුපියල් කෝටි 2·26 කින්ද සමුපකාර ආයතනයන්ට දුන් ලෝන සහ අයිරාවන් රුපියල් කෝටි 2·57 කින් ද වැඩි වූ බැව් පෙනේ. පෞද්ගලික ව්‍යාපාරයනට හා පුද්ගලයන්ට දෙනු ලැබූ ලෝන සහ

1. පෞද්ගලික ව්‍යාපාරයන් රජයේ සමායතනයන් සමුපකාර සංස්ථාවන් අර්ධ රාජ්‍ය සංස්ථාවන් හා පළාත් ආණ්ඩු සභා යන මේ සියල්ලම පෞද්ගලික අංශයට ඇතුළත් වන පරිදි විග්‍රහ කර ඇත

අයිරාවන් අවුරුද්දේ දෙවැනි භාගයේ දී පිරිහින. රජයේ සමායතනයන්ට හා සමුපකාර ආයතනයනට[1] දෙනු ලැබූ ලෝන සහ අයිරාවන් බෙහෙවින් ම වැඩි වූයේ අවුරුද්දේ අවසාන භාගයේ දීය.

1964 දී බැංකු ණය වැඩි වූයේ බෙහෙවින් ම වාණිජ කාර්මික සහ මූල්‍ය කටයුතු සඳහා වූ ණය වැඩිවීම නිසා බව II ඉ 16 සංඛ්‍යා සටහනෙන් පෙනේ. පරිභෝජනය හා කෘෂිකාර්මික කටයුතු සඳහා දුන් අත්තිකාරම් ද තරමක් වැඩි විය. එහෙත් "අනෙකුත් ණය" යනුවෙන් හැඳින්වෙන අවශේෂ අත්තිකාරම් වසර තුළ අඩු විය.

වාණිජ කටයුතු සඳහා දෙනු ලැබූ බැංකු ණය රුපියල් කෝටි 3·66 කින් වැඩිවීමෙන් පිළිබිඹු වූයේ ආනයන වෙළෙඳම හා තොග හා සිල්ලර වෙළෙඳම සඳහා දුන් බැංකු ණය වැඩිවීමෙකි. මූල්‍ය කටයුතු සඳහා දුන් අත්තිකාරම් වැඩිවීම මුළුමනින් ම "ආයෝජන ණය" වැඩිවීම නිසා ඇති වූවක් විය. කෘෂිකාර්මික ණය වසර තුළ රුපියල් කෝටි 0·32 කින් වැඩි විනි. ඉංජිනේරු සහ ගොඩනැගිලි කර්මාන්තයන් සඳහා දෙනු ලැබූ ණය රුපියල් කෝටි 1·05 කින් ද "අනෙකුත් කර්මාන්තයන්" සඳහා දුන් ණය රුපියල් කෝටි 1·26 කින් ද වැඩිවීම නිසා කාර්මික අත්තිකාරම් වැඩි විණ. පාරිභෝජන කටයුතු සඳහා දෙනු ලැබූ ණය වැඩි වූයේ රුපියල් කෝටි 1·23 කිනි.

සංඛ්‍යා සටහන II (ඉ) 16

**අත්තිකාරම්* අරමුණු හා කල පිරීම අනුව**

රුපියල් දශ ලක්ෂ

| පරමාර්ථය | | | කෙටි කාලීන 6 මාසයට අඩු | | මැදි කාලීන (මාසයේ සිට මාස 30 ට වැඩි) | | දිගු කාලීන (මාස 30 ට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | (1) | (2) 7 හි % වශයෙන් (1) | (3) | (4) 7 හි % වශයෙන් (3) | (5) | (6) 7 හි % වශයෙන් (5) | (7) | (8) එකතුවෙහි % වශයෙන් (7) |
| අ. වානිජ | දෙසැම්බර් | 1963 | 196·0 | 43·4 | 182·4 | 40·4 | 73·2 | 16·2 | 451·6 | 65·4 |
| | ජූනි | 1964 | 200·8 | 41·1 | 210·1 | 43·0 | 77·1 | 15·8 | 488·1 | 63·5 |
| | දෙසැම්බර් | 1964 | 245·3 | 50·2 | 173·8 | 35·6 | 69·1 | 14·2 | 488·2 | 62·4 |
| ආ. මූල්‍ය | දෙසැම්බර් | 1963 | 18·7 | 26·3 | 26·1 | 36·7 | 26·4 | 37·1 | 71·1 | 10·3 |
| | ජූනි | 1964 | 32·2 | 37·4 | 26·5 | 30·8 | 27·2 | 31·6 | 86·0 | 11·2 |
| | දෙසැම්බර් | 1964 | 26·5 | 29·1 | 30·0 | 32·9 | 34·6 | 38·0 | 91·1 | 11·6 |
| ඇ. කෘෂිකාර්මික | දෙසැම්බර් | 1963 | 5·9 | 23·0 | 5·7 | 22·2 | 14·2 | 55·2 | 25·7 | 3·7 |
| | ජූනි | 1964 | 8·8 | 27·8 | 7·1 | 22·3 | 15·8 | 49·7 | 31·8 | 4·1 |
| | දෙසැම්බර් | 1964 | 6·3 | 21·8 | 7·9 | 27·3 | 14·7 | 50·9 | 28·9 | 3·7 |
| ඈ. කාර්මික | දෙසැම්බර් | 1963 | 8·6 | 19·8 | 16·7 | 38·5 | 18·0 | 41·5 | 43·4 | 6·3 |
| | ජූනි | 1964 | 17·1 | 26·7 | 23·0 | 35·9 | 24·0 | 37·4 | 64·1 | 8·3 |
| | දෙස,ම්බර් | 1964 | 24·8 | 34·4 | 20·1 | 27·9 | 27·2 | 37·7 | 72·1 | 9·2 |
| ඉ. පාරිභෝජන | දෙසැම්බර් | 1963 | 7·7 | 21·0 | 10·0 | 27·3 | 19·0 | 51·9 | 36·6 | 5·3 |
| | ජූනි | 1964 | 7·9 | 20·8 | 11·2 | 29·5 | 18·9 | 49·7 | 38·0 | 4·9 |
| | දෙසැම්බර් | 1964 | 12·0 | 24·5 | 15·0 | 30·7 | 21·9 | 44·8 | 48·9 | 6·4 |
| ඊ. අනෙකුත් ණය | දෙසැම්බර් | 1963 | 29·7 | 48·0 | 7·1 | 11·5 | 25·1 | 40·5 | 61·9 | 9·0 |
| | ජූනි | 1964 | 32·8 | 53·9 | 8·3 | 13·6 | 19·8 | 32·6 | 60·8 | 7·9 |
| | දෙසැම්බර් | 1964 | 25·0 | 47·6 | 9·2 | 17·5 | 18·4 | 35·0 | 52·5 | 6·7 |
| උ. එකතුව | දෙසැම්බර් | 1963 | 266·6 | 38·6 | 247·9 | 35·9 | 175·9 | 25·5 | 690·4 | 100·0 |
| | ජූනි | 1964 | 299·6 | 39·0 | 286·3 | 37·2 | 182·8 | 23·8 | 768·7 | 100·0 |
| | දෙසැම්බර් | 1964 | 339·9 | 43·5 | 255·9 | 32·7 | 185·9 | 23·8 | 781·7 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි,

* ලෝන, අයිරාවන් හා වට්ටම් කරන ලද බිල්පත් අත්තිකාරම් වලට ඇතුළත් වේ. එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ එයට ඇතුළත් නොවේ.

1. සහතික මිල ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සමුපකාර ආයතනයනට දෙනු ලබන කෙටිකාලීන බැංකු ණය, එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන් යටතේ 11 ඉ 14 සංඛ්‍යා සටහනෙහි දැක්වේ මේ කෙටි කාලීන ණය සමුපකාර ආයතනයන්ට දෙනු ලැබූ ලෝන සහ අයිරාවන් පිළිබඳ තොරතුරු වලට අයත් නොවේ.

කල්පිරීම අනුව විග්‍රහ කරන විට ද වාණිජ බැංකු ණය සංයුතිය මදක් වෙනස් වී ඇති බැව් පෙනේ. කෙටිකාලීන ණය පරිමාව සාපේක්ෂිතව වැඩි වූ අතර, මුළු බැංකු අත්තිකාරම් වලට වූ කෙටි කාලීන අත්තිකාරම් (එනම්, හය මාසයකට අඩු කාලයක් තුළ දී පියවිය යුතු ණය) අනුපාතිකය 1963 දී සියයට 38·6 ක්ව තිබී 1964 දී සියයට 43·5 දක්වා වැඩි විය. මාස 6 – 30 අතර පියවිය යුතු අත්තිකාරම් අනුපාතිකය සියයට 35·9 සිට සියයට 32·7 දක්වා අඩු වූ අතර, මාස 30 ක හෝ ඊට වැඩි කාලයක කල්පිරීම් ඇති ණය අනුපාතිකය සියයට 25·5 සිට සියයට 23·8 දක්වා පහත වැටිණ.

සංඛ්‍යා සටහන II (ඉ) 17

අත්තිකාරම්* ඇප වර්ග අනුව

| ඇප වර්ගය | 1963 දෙසැම්බර් 31 | | 1964 ජූනි 30 | | 1964 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් |
| ලේඛන ගත බිල් .. .. | 141·5 | 20·5 | 147·9 | 19·2 | 154·7 | 19·8 |
| රජයේ සුරැකුම් පත් .. .. | 5·9 | 0·8 | 7·5 | 1·0 | 9·6 | 1·2 |
| බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් .. .. | 18·6 | 2·7 | 17·9 | 2·3 | 20·3 | 2·6 |
| කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු හා අනෙකුත් මුදල් තැන්පතු (ජීවිත රක්ෂණ ඔප්පුවල වටිනාකම ඇතුළුව) .. | 30·9 | 4·5 | 35·9 | 4·7 | 34·0 | 4·3 |
| වෙළෙඳ තොග .. .. | 200·6 | 29·0 | 236·8 | 30·8 | 210·2 | 26·9 |
| නිශ්චල දේපොල .. .. | 68·8 | 10·0 | 67·2 | 8·7 | 73·9 | 9·5 |
| අනෙකුත් .. .. | 133·5 | 19·3 | 138·1 | 18·0 | 202·1 | 25·9 |
| ඇප රහිත .. .. | 90·7 | 13·1 | 117·4 | 15·3 | 76·8 | 9·8 |
| එකතුව .. .. | 690·4 | 100·0 | 768·7 | 100·0 | 781·7 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවනි.

* එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන් අයත් නොවේ.

ඉහත එන සංඛ්‍යා සටහනෙහි බැංකු අත්තිකාරම් ඇප වර්ග අනුව විග්‍රහ කර ඇත. 1964 දී සෑම ඇප වර්ගයක් වෙනුවෙන් දෙන ලද ණය වැඩි වී ඇත. ඇප රහිත අත්තිකාරම්, ජූනි මාසයේ දී රුපියල් කෝටි 2·67 කින් වැඩි වුවද, දෙසැම්බර් මාසයේ දී රුපියල් කෝටි 4·06 කින් පහත වැටිණි. මුළු වසර තුළ ඇප රහිත අත්තිකාරම් රුපියල් කෝටි 1·40 කින් අඩු විය. "අනෙකුත් ඇප වර්ගයන්" වශයෙන් විග්‍රහ වෙන අවශේෂ අත්තිකාරම්වල කෝටි 6·9 ක සැලකිය යුතු වැඩිවීමක් දක්නා ලදී. මුළු බැංකු අත්තිකාරම් වල අනුපාතිකයක් වශයෙන් මේ අත්තිකාරම් සියයට 19·3 සිට සියයට 25·9 දක්වා සියයට 6·6 කින් වැඩි විය.

පහත එන II ඉ - 18 සංඛ්‍යා සටහනෙහි වෙළෙඳ බැංකු අත්තිකාරම් පොළී අනුපාතිකයන් අනුව විග්‍රහ කෙරේ.

සංඛ්‍යා සටහන II (ඉ) 18

**වෙළෙඳ බැංකු අත්තිකාරම්* - පොලි අනුපාතිකයන් අනුව**

| පොලි අනුපාතිකය | 1963 දෙසැම්බර් 31 | | 1963 ජූනි 30 | | 1964 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් |
| 2½ ට අඩු | 4·8 | 0·8 | 7·0 | 1·0 | 4·0 | 0·5 |
| 2½ | 0·3 | ... | ... | ... | — | — |
| 3 | 1·4 | 0·2 | 0·6 | 0·1 | 0·9 | 0·1 |
| 3½ | 15·3 | 2·5 | 18·0 | 2·5 | 2·2 | 0·3 |
| 4 | 2·0 | 0·3 | 5·0 | 0·7 | 3·7 | 0·5 |
| 4½ | 10·7 | 1·7 | 13·5 | 1·9 | 38·2 | 5·2 |
| 5 | 52·0 | 8·4 | 66·8 | 9·4 | 54·6 | 7·5 |
| 5½ | 12·3 | 2·0 | 22·8 | 3·2 | 14·2 | 1·9 |
| 6 | 273·3 | 44·2 | 315·9 | 44·6 | 299·2 | 40·9 |
| 6½ | 27·9 | 4·5 | 29·8 | 4·2 | 23·5 | 3·2 |
| 7 | 169·6 | 27·4 | 156·2 | 22·1 | 209·2 | 28·6 |
| 7½ | 5·8 | 0·9 | 8·2 | 1·2 | 7·2 | 1·0 |
| 8 සහ ඉන් වැඩි | 43·3 | ·0 | 64·2 | 9·1 | 75·0 | 10·2 |
| එකතුව | 618·8 | 100·0 | 708·0 | 100·0 | 732·0 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුව

* පවත්නා විනිමය අනුපාතිකයන් අනුව මිලට ගත් අපනයන බිල්පත් හා එකතු කෙරිගෙන යන මුදල් ශීර්ෂයන්ද අයත් නොවේ.

වසර තුල දෙනු ලැබූ බැංකු අත්තිකාරම් වලින් වැඩි කොටසක් සියයට 6 සහ සියයට 7 පොලී අනුව දුන් ඒවා විය. සියයට 4½ සහ සියයට 8 පොලියට දෙනු ලැබූ අත්තිකාරම් ද සැහෙන පමණ වැඩිවිය. වෙළෙඳ බැංකු විසින් දෙනු ලැබූ මුළු අත්තිකාරම් වලට පොදුවූ පොලී අනුපාතික සාමාන්‍යය සියයට 6 ක්ව පැවතිය ද සියයට 6 පොලියට දුන් අත්තිකාරම් සියයට 44·2 (1963) සිට සියයට 40·9 (1964) දක්වා අඩු විය. තුලනාත්මක වූ වැඩි පොලී අනුව දෙනු ලැබූ අත්තිකාරම්ද වසර තුල වැඩි විය. 1963-1964 කාලපේඡදයන් අතර, සියයට 6 ට වැඩි පොලියක් දෙනු ලැබූ අත්තිකාරම් රුපියල් කෝටි 24·7 සිට රුපියල් කෝටි 31·5 දක්වා වැඩි වූ අතර, එම අත්තිකාරම්වල අනුපාතිකයද සියයට 39·8 සිට සියයට 43·0 දක්වා ඉහල නැංගේය.

1964 දී බැංකු ණය වැඩිවීම පිළිබඳව කැපී පෙනෙන අංගයක් වූයේ ණය ව්‍යාප්තිය අවුරුද්දේ මුල් හත් මාසයට පමණක් සීමා වීමයි. එසේ වුවද, අවුරුද්දේ අවසාන භාගයේදී රජයේ සමායතනයන්ට දෙනු ලැබූ ණය ප්‍රසාරණය වෙමින් පැවතින. කෙටි කාලීන ණය අවශ්‍යතාවයන් සඳහා භාණ්ඩාගාරයෙන් ණය ගනු වෙනුවට රජයේ සමායතනයන් වෙළෙඳ බැංකු වලින් ණය ගනිතැයි මුදල් ඇමති-වරයාගේ අයවැය වාර්තාවෙන් අපේක්ෂා කරන ලදී.

1964 දී අපනයන සහ ආනයන 1963 දීට වඩා වැඩි වුවද, අපනයන බිල්පත් සහ අපනයන වෙළෙඳම සඳහා දුන් අනිකුත් අත්තිකාරම් ද අඩු වූ බැව් පෙනේ. ආනයන බිල්පත් සහ ආනයන වෙළෙඳම සඳහා දුන් අත්තිකාරම් ශීඝ්‍රයෙන් වැඩිවිය. වෙළෙඳ තොග ඇප කොට දුන් අත්තිකාරම් අවුරුද්ද මැද දී සෑහෙන පමණ වැඩි වුවද, අවුරුද්දේ අවසාන භාගයේ දී පිරිහින. මුළු වසර තුළ මේ අත්තිකාරම් ඉකුත් වසරට වඩා වැඩි වූයේ සුළු වශයෙනි. අරමුණු අනුව බැංකු අත්තිකාරම් විග්‍රහ කිරීමේදී දක් වූ පරිදි අපනයන වෙළෙඳම සඳහා දුන් බැංකු ණය වැඩිවීමෙන් ද, ඇප වර්ගයන් අනුව කෙරුණු විග්‍රහයේ දැක්වුනු පරිදි භාණ්ඩ තොග ඇප කොට දුන් ණය වැඩිවීමෙන් ද පිළිබිඹු වන්නේ මේ ගනුදෙනු යයි සිතිය හැක. 1963 දීට වඩා 1964 දී ආනයන වැඩිවීමද, ආනයන බලපත්‍රයන් අර්ධ වාර්ෂිකව නිකුත් කිරීම නිසා ආනයනයන් ඒකරාශි වීමද නිසා මෙසේ ආනයන සඳහා දෙනු ලැබූ බැංකු ණය වැඩිවිනැයි සිතිය හැක.

ඇප රහිතව දෙන ලද ණය, අවුරුද්ද මැදදී ශීඝ්‍රයෙන් වැඩි වුවද, 1964 අවසානයේ දී, ඉකුත් වර්ෂාවසානයේදී පැවති මට්ටමටත් වඩා අඩුවිය. එසේ වුවද "අනෙකුත්" ඇප වර්ගයන් වෙනුවෙන් දුන් ණය 1964 දෙවැනි භාගයේ දී වේගයෙන් වැඩි වූ බැව් පෙනේ.

## 3. ඉතිරිකිරීම් හා දිගු කාලීන ණය දෙන ආයතන

වාණිජ බැංකු නොවන, අනිකුත් දිගු කාලීන ණය දෙන ආයතනයනගේ ණය ගනුදෙනු පහත සඳහන් II ඉ – 19 සටහනෙහි දක්වේ.

සංඛ්‍යා සටහන II (ඉ) 19

### දිගුකාලීන ණය දෙන ආයතනයන්ගේ ණය ගනුදෙනු

රුපියල් දහස් ගණනින්

| | 1961 | | 1962 | | 1963 | | 1964 | |
|---|---|---|---|---|---|---|---|---|
| | දෙන ලද ණය | නොබේරූ ණය | දෙන ලද ණය | නොබේරූ ණය | දෙන ලද ණය | නොබේරූ ණය | දෙන ලද ණය | නොබේරූ ණය |
| සංවර්ධන මුදල් සමායතනය * .. | 4,318 | 20,931 | 3,555 | 22,841 | 1,864 | 23,072 | 7,231 | 27,802 |
| ලංකා ඉතිරිකිරීම් බැංකුව .. | 2,435 | 10,302 | 2,801 | 11,635 | 3,428 | 13,387 | 3,935 | 15,619 |
| කෘෂිකාර්මික හා කාර්මික ණය සමායතනය .. | 2,905 | 30,706 | 2,477 | 29,874 | 3,338 | 29,501 | 5,774 | 31,018 |
| රජයේ උකස් බැංකුව .. .. | 5,442 | 56,994 | 2,553 | 55,785 | 3,135 | 55,119 | 3,532 | 54,662 |
| ණය මණ්ඩලය .. .. .. | 2,284 | 11,937 | 1,660 | 12,309 | 1,033 | 12,204 | 1,107 | 12,113 |
| ජාතික නිවාස දෙපාර්තමේන්තුව **† | 31.880 | ල. නො. | 9,799 | ල. නො. | 9,208 | ල. නො. | 3,914 | ල. නො. |
| එකතුව | 31,264 | 130,870 | 22,845 | 132,444 | 22,006 | 133,283 | 25,493 | 141,214 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ පැංකුව

* සාමාන්‍ය කොටස් ගැනීමද ඇතුළති.

** මුදල් වර්ෂය ඔක්තෝබර් / සැප්තැම්බර්

† දෙපාර්තමේන්තු නිවාස ක්‍රමයන්ද ඇතුලත් වේ.

විශේෂිත මූල්‍ය සංස්ථාවන් විසින් 1964 දී දෙනු ලැබූ මුළු ණය පරිමාව රුපියල් කෝටි 0·35 කින් රුපියල් කෝටි 2·55 දක්වා වැඩිවී ඇත. සංවර්ධන මුදල් සමායතනය, කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය, රජයේ උකස් බැංකුව සහ ලංකා ඉතිරි කිරීම් බැංකුව විසින් දෙන ලද ණය වසර තුළ වැඩි වුවද, ජාතික නිවාස දෙපාර්තමේන්තුව විසින් දෙන ලද ණය සැළකිය යුතු අන්දමින් අඩුවිය. ඉහත සඳහන් සංස්ථාවන් විසින් මෙතෙක් දී ඇති ණයෙන් නොපිය වූ ඉතුරුව 1964 අවසානයේ දී රුපියල් කෝටි 14·12 ක් විය. 1963 දී මෙසේ නොපියවා ඉතිරිව තුබූ ණය රුපියල්කෝටි 13·33 ක් විය.

සංඛ්‍යා සටහන II ඉ – 20

**ඉතිරි කිරීම් තැන්පතු හා ඉතිරි කිරීම් සහතික**

රුපියල් දශ ලක්ෂ

| | දෙසැම්බර් 1963 | දෙසැම්බර් 1964 | වෙනස 53 දෙසැ:/64 දෙසැ: |
|---|---|---|---|
| තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැකුව .. | 375·5 | 393·4* | + 19·9* |
| ලංකා ඉතිරි කිරීම් බැංකුව .. .. | 77·2 | 79·3* | + 2·1* |
| වෙළෙඳ බැංකු (කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ** .. .. | 499·2 | 551·1 | + 51·9 |
| නොපියවූ ඉතිරි කිරීම් සහතික .. .. | 34·4 | 37·4 | — 3·0 |
| එකතුව .. .. | 986·3 | 1061·2* | + 74·9* |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* තාවකාලිකයි.

** රජය සතු තැන්පතු ඇතුළත්ය.

තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුවේ හා ලංකා ඉතිරි කිරීම් බැංකුවේ ඇති ඉතිරි කිරීම් තැන්පතු, වාණිජ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු හා ඉතිරි කිරීම් සහතික වල එකතුව, 1964 දී රුපියල් කෝටි 7·49 කින් හෙවත් සියයට 7·6 කින් වැඩිවිය. ඉකුත් වසරේ මුළු ඉතිරි කිරීම් පරිමාව වැඩි වූයේ රුපියල් කෝටි 8·93 කින් හෙවත් සියයට 9·9 කිනි. වෙළෙඳ බැංකු වෙත වූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 5·19 කින් වැඩි වූ අතර තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුවෙහි වූ ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 1·79 කින් වැඩි විය. 1964 දී සේවක අර්ථසාධක අරමුදලට එකතු වූ මුළු මුදල රුපියල් කෝටි 6·09 ක් විය.